

# 2022

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

**දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය**

தொலைதூர கற்கை நிலையம்

**Distance Learning Centre**

State Owned Institute Under
Ministry of Public Administration

DLC
Distance Learning Centre Ltd.
Connecting Minds

GLOBAL DEVELOPMENT LEARNING NETWORK
GDLN

# අන්තර්ගතය

| | |
|---|---|
| ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව | 3 |
| දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිළිබඳ සටහන | 4 |
| දැක්ම හා මෙහෙවර | 7 |
| ආයතනික තොරතුරු | 8 |
| මානව සම්පත් | 9 |
| භෞතික සම්පත් | 10 |
| නිෂ්පාදිත හා සේවාවන් | 11 |
| 2022 වසරේ පවත්වන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන් | 12 |
| මූල්‍ය වශයෙන් වැදගත් සිදුවීම් | 15 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 16 |
| බාහිර විගණක වාර්තාව | 20 |
| මූල්‍ය ප්‍රකාශන | 26 |
| අතිරේක | |
| වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය | i |
| නියෝජිතයින් පත් කිරීමේ අයදුම්පත | ii |

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව



*ගර්ෂෝන් අරුලානන්දම්*

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් හි සම්පූර්ණ මෙහෙයුම් කටයුතු පූර්ව කොවිඩ් වසරවල පැවති තත්ත්වයට නැවත පැමිණීමත් සමග අපි දිගුකාලීන පුහුණු අවශ්‍යතා සහිත නව සේවාදායකයින් සමග අපගේ ආදායම අඛණ්ඩව වැඩිකර ගනිමින් සිටිමු.

වසරේ සිදුවූ වැදගත් සිදුවීම් අතුරින් එකක් වූයේ, ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් වසර ගණනාවක සිට පුහුණු වීම් කටයුතු සිදු කරන බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග ගිවිසුමක් අත්සන් කිරීමයි. එමෙන්ම විවිධ මට්ටම්වල රාජ්‍ය නිලධාරීන් ගණනාවක් සමග මාර්ගගත පුහුණුවීම් ගණනාවක් සිදු කෙරිණි. මෙම මාදිලිය හරහා අන්තර්ක්‍රියාකාරී ඩිජිටල් පුහුණුව ගෙන ඒම සඳහා ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් සතු වූ හැකියාව වැඩි කිරීමට මෙම මාර්ගගත පුහුණුව ද සාධකයක් විය.

අලෙවිකරණ කාර්ය මණ්ඩලයේ හිඟය සමග 2022 වසරද දුෂ්කරතා සහිත වසරක් වුවත්, පළාත්වල ප්‍රබල කාර්ය සාධනයක් සහිතව ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් මූල්‍යමය වශයෙන් යහපත් සංඥාවන් නිකුත් කරමින් සිටී. දීර්ඝකාලීන උපාය මාර්ගයක් ලෙස, ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින රජයේ නිලධාරීන්ට පුහුණුව ලබා දීම පිණිස ඩිජිටල් වේදිකාවක් සඳහා ආයෝජනය කිරීමට සිදුව තිබේ.

ඒ අනුව 2023 වසර යනු ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් නැවත වරක් ලාභදායී බවට පත් කිරීම පිණිස ඩිජිටල් වේදිකාවක ආයෝජනය කරන වසර විය යුතුව ඇත.

**ගර්ෂෝන් අරුලානන්දම්**
**ප්‍රධාන විධායක නිලධාරී,**
**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර්**

කොළඹ, ශ්‍රී ලංකාව

# දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිළිබඳ සටහනක්

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, ගෝලීය මට්ටමින් යහපත් පුරුදු කෙරෙහි අවධානය යොමු කරමින් රජයේ හා පෞද්ගලික අංශයේ කාර්යමණ්ඩලයේ ධාරිතාවන් වර්ධනය කිරීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා රජය විසින් 2002 වසරේදී ස්ථාපිත කරන ලද ප්‍රමුඛ පෙළේ පුහුණු ආයතනවලින් එකකි. පසුගිය වසර කිහිපය පුරාම, දේශීය සම්පත් ලබාගැනීමෙන් පමණක් නොව, ලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ සහායද සහිතව එම කාර්යමණ්ඩලයන්ගේ ශාස්ත්‍රීය සහ වෘත්තීයමය දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම මගින් එම කාර්යමණ්ඩල වෙත සේවය ලබා දීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකි විය. මෙම ඉගෙනුම් මධ්‍යස්ථානයේ පුහුණු කාර්යයන් සාම්ප්‍රදායික චින්තනයේ සීමාවලින් බැහැරව සිදු කරන අතර, එමගින් ඔවුනොවුන් සංවර්ධනය කරගනිමින් සිය කාර්යසාධනය පැහැදිලි කරගැනීමට උපකාරී වේ.

පසුගිය වර්ෂ කිහිපය පුරාම දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය සාම්ප්‍රදායික ලෙස දැනුම බෙදාහැරීම සිදුකරගෙනයාමකට වඩා අවශ්‍ය කොටස් වෙත ඉල්ලුම මත වැඩසටහන් පවත්වාගෙන යාමෙහි නියුතුව ඇත. මෙම මධ්‍යස්ථානය විසින් අද දිනයේ වෙනස්වන ව්‍යාපාරික පරිසරය දෙස බලා සේවාදායක කේන්ද්‍රීය ප්‍රවේශය භාවිත කරමින් නිශ්චිත වැඩසටහන් සංවර්ධනය කර ඇත. මෙම නව ගමන්මග සමඟම, සිය සේවාදායකයින් වෙත වටිනාකමක් ලබා දීමට මෙම මධ්‍යස්ථානයට හැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අතිශයින් දුෂ්කරසහගත වර්ෂයක් මධ්‍යයේ වුවද වර්ෂයේ මාස කිහිපයක් පුරා සිය පහසුකම් විවෘතව තැබීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකි විය. එසේ වුවද, සිය උපායමාර්ගික අරමුණුවලින් උත්පාදනය වන පැහැදිලි ගමන්මග සමඟ එළඹෙන වසරවලදී කාර්යසාධනය තුළ මෙම ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

වගුව 1: 2021 වර්ෂය සඳහා ආදායම් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ.

| ආදායම් කාණ්ඩ | රු |
|---|---|
| පරිගණක පද්නම් පුහුණු පහසුකම | 982,000.00 |
| මුහුණට මුහුණ ලා කෙරෙන පුහුණුවීම් පහසුකම | 1,709,300.00 |
| වීඩියෝ සංවාද පහසුකම | 6,000.00 |
| මුහුණට මුහුණලා කුලී පහසුකම | 1,161,920.00 |
| පරිගණක පදනම් කුලී පහසුකම | 224,800.00 |
| ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ | 906,000.00 |
| මාර්ගගත විභාග | 12,888,570.00 |
| මාර්ගගත වැඩසටහන් | 6,189,300.00 |
| | **24,067,890.00** |

වගුව 2 - බදුවලට පෙර ශුද්ධ ලාභය (රු)

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| මුළු ආදායම් (මූල්‍ය ආදායම් ඇතුලුව) | 69,671,388 | 67,769,778 | 73,388,537 | 24,170,166 | 24,384,600 | **35,591,247** |
| මුළු වියදම් | (55,552,355) | (52,651,915) | (57,676,699) | (27,969,575) | (28,247,954) | **(37,819,501)** |
| ආදායම් බදුවලට පෙර ලාභය | 14,119,033 | 15,117,863 | 15,711,838 | (3,799,409) | (3,863,354) | **(2,228,253)** |

වගුව 3 - දළ ලාභය (රු)

| දළ ලාභය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන මෙහෙයුම්වලින් ආදායම | 2,953,972 | 59,779,244 | 64,674,064 | 16,262,903 | 18,486,551 | **24,067,890** |
| වීකුණුම් පිරිවැය | (29,154,623) | (21,572,552) | (23,138,534) | (3,001,550) | (4,032,854) | **(5,735,779)** |
| දළ ලාභය | 33,799,349 | 38,206,692 | 41,535,530 | 13,261,353 | 14,453,696 | **18,332,111** |
| දළ ලාභ අනුපාතය | 54% | 64% | 64% | 81% | 78% | **76%** |

## දැක්ම

මානව සම්පත් සංවර්ධනය හා ආයතනික වෙනස්කම් උදෙසා පවතින

එකම ඩිජිටල් මධ්‍යස්ථානය බවට පත් වීම

අපගේ අවශ්‍යතාවය යි.

## මෙහෙවර

අපි සාර්ථක අභ්‍යන්තර ඩිජිටල් පරිවර්තනයක් ගොඩ නගා, පුද්ගල ආවේණික ඩිජිටල් සේවා වර්ධනය කර, ඩිජිටල් ඉගෙනුම් සහ සේවාදායක ආයතන ඩිජිටල්මය වශයෙන් පරිවර්තනය කිරීම සඳහා පවත්නා දැඩි ඉල්ලුම සපුරාලීම සඳහා නැඟී සිටිමු.

## අපගේ වටිනාකම්

- නවෝත්පාදනීය හා නිර්මාණශීලී බව
- පාරිභෝගික අවශ්‍යතා කෙරෙහි ප්‍රතිචාරාත්මක වීම
- බලවත් අවශ්‍යතාවය මත පදනම් වීම
- වගවීම හා කැපවීම
- නිපුණතා සංවර්ධනය පිළිබඳව විශ්වාසය

# ආයතනික තොරතුරු

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද්දේ සමාගම් පනත යටතේ 2001 නොවැම්බර් 01 වනදා වන අතර 2002 මාර්තු 26 වනදා එහි මෙහෙයුම් කටයුතු ආරම්භ විය.

මෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 10 ක් වන සාමාන්‍ය කොටස් 14,206,509 කින් සමන්විත වන අතර ඉන් 100% (14,206,509) ක්ම ශ්‍රී ලංකා රජයට හිමි වේ. මෙය රජයේ අයවැය හෝ සහනාධාර මත යැපීමෙන් තොරවූද ස්වයං අරමුදල් යොදවනු ලබන්නා වූද ව්‍යවසායකත්වයක් වේ.

එමෙන්ම එය, අන්තර්ක්‍රියාකාරී, බහු නාලිකා ජාල සහ නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයක් වන බහු පාර්ශ්ව වීඩියෝ සම්මන්ත්‍රණ, අන්තර්ජාලය සහ වෙනත් උසස් සන්නිවේදන තාක්ෂණයන් යොදාගෙන පිරිවැය ඵලදායී ඉගෙනුම් අවස්ථා හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සපයන ලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ කොටසක්ද වේ. එයට වෙනත් ජාත්‍යන්තර පුහුණු ආයතන සමගද සබඳතා ඇති අතර ශ්‍රී ලංකාව තුළ ඒවායේ පාඨමාලා පැවැත්වීමට වරප්‍රසාද ලද්දේද වෙයි.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය CIMA සහ ACCA මාර්ගගත විභාග සඳහා පරීක්ෂණ මධ්‍යස්ථානයක් වන අතර කොළඹදී එවැනි විශාල සුරක්ෂිත පහසුකම් ලබාගත හැකි එකම ස්ථානය එය වේ. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2017 වසරේදී දකුණු ආසියාවේ විශාලතම CIMA පරීක්ෂණ මධ්‍යස්ථානය බවට පත් වූ අතර සෑම වසරකම විභාග අපේක්ෂකයන් 2000 කට අධික පිරිසකට විභාගයට පෙනී සිටීමට අවස්ථාව සපයනු ලබයි.

**මූලික කටයුතු**

ගෝලීය දැනුම් බෙදාහැරීම, ඊ -ඉගෙනුම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ පුහුණු කිරීම්, අධ්‍යාපන අංශයේ පුහුණු කිරීම් සහ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවාදායකයන්ට ව්‍යාපාරික හමු හා වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ඉහළම මට්ටමේ පහසුකම් සැපයීම. ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර විභාග පවත්වන ආයතන සඳහා සුරක්ෂිතව මාර්ගගත විභාග පැවැත්වීමේ පහසුකමද දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් සපයනු ලැබේ.

**ලියාපදිංචි කාර්යාලය**

28/10, මලලසේකර මාවත, කොළඹ 07

**විගණකවරු**

විගණකාධිපති, ශ්‍රී ලංකාව

**ලේකම්වරු**

Accounting Systems Secretarial Services (Private) Limited.

**බැංකුකරු**

ලංකා බැංකුව

# මානව සම්පත්

## කළමනාකරණ කණ්ඩායම

### ප්‍රධාන විධායක නිලධාරී



ගර්ෂෝන් අරුලානන්දම්
ACIM (UK), FIM (SL), MBA (Peradeniya)

### තොරතුරු තාක්ෂණ කළමනාකරු



අරුණ බුද්ධික
MSc SITM (UK), ACS

### ඉගෙනුම් සංවර්ධන හා අලෙවිකරණ කළමනාකරු



කීර්ති විජේසේකර
MCIM (UK), AABE (UK) MBA Uni Sunderland UK,
MSc HRM & Dev. University of Salford UK

### මූල්‍ය හා පරිපාලන කළමනාකරු



ලක්ෂිකා කළුබෝවිල
BBA (Sp) 2nd Upper (Hons.),
MBA (Colombo), CBA , MAAT

### සහකාර අලෙවි කළමනාකරු



වජිර අබේනායක
Advance Diploma in Business Management
(NIBM)

### අපගේ කණ්ඩායමේ අනෙක් සාමාජිකයන්



<u>වමේ සිට</u>

**සුලේඛ දිසානායක (පරිපාලන සහකාර),**
**නිරෝෂා ප්‍රියදර්ශනී (වැඩසටහන් සමායෝජක),**
**ලක්මාලි සමරසේකර (විධායක ලේකම්),**
**ධනුෂ්කා දූෂන්ති (වැඩසටහන් සම්බන්ධීකාරක),**
**නයනි කල්පගේ (මුදල් සහ පරිපාලන සම්බන්ධීකාරක),**
**රොමේෂ් පෙරේරා (තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක)**

# භෞතික සම්පත්

### නවීනතම තත්ත්වයේ වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම

පුද්ගලික මයික්‍රෆෝන සහිත සක්‍රිය සහභාගිවන්නන් 30 ක් හා අනෙකුත් නිරීක්ෂකයන් 50 කට පහසුකම් සැපයිය හැකිය.













### පරිගණක සහිත බහු මාධ්‍ය කාමර ද්වය

එකක් පරිගණක 30 කින්ද අනෙක පරිගණක 50 කින්ද සමන්විතය

### Pearson VUE Testing Center

(ආසන 90 කින් සමන්විතය)






අවශ්‍ය විට දේශන කාමරයක් ලෙස භාවිතා කළ හැකි ඉඩකඩ සහිත ලොබිය

සියලුම සම්මන්ත්‍රණ කාමර සඳහා ඕඩියෝ සංවාද පහසුකම් ඇත

## දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ පහත සේවාවන් සපයනු ලබයි

- සංකලිත ඉගෙනුම් ක්‍රම භාවිතයට ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය, ස්වභාවික සම්පත් කළමනාකරණය හා විද්‍යාව සහ දේශගුණ විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිය යනාදී තේමා ඔස්සේ පවත්වනු ලබන සහතික පත්‍ර පාඨමාලා
- විපත් අවස්ථාවන්හිදී හෙද සත්කාර සහ Partograph යනාදී විෂයයන් සම්බන්ධයෙන් ලොව පුරා පවතින විවිධ සම්පත් මධ්‍යස්ථාන මගින් සපයනු ලබන පුහුණු වැඩසටහන් සමග වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ සම්බන්ධ වීම
- ලොව වෙනත් ප්‍රදේශවල වෙසෙන කීර්තිමත් කථිකයින් (ඒ ඒ විෂයයන්හි ප්‍රවීණයින්) විසින් පවත්වනු ලබන කෙටි සම්මන්ත්‍රණ සහ ඉදිරිපත්කිරීම්
- කොරියානු සංවර්ධන අත්දැකීම් වැනි තේමා ඔස්සේ විවිධ රටවල් සම්බන්ධ කරමින් පවත්වනු ලබන ගෝලීය අත්දැකීම් හුවමාරු කරගැනීමේ සංවාද
- වෙබ් යෙදුම් ආරක්ෂණය (Web Application Security) වැනි පාරිභෝගික අවශ්‍යතාවන් සැපිරීම සඳහා ඒ ඒ පුද්ගලයින් හෝ කාර්යයන් සඳහා සැකසූ පුහුණු වැඩසටහන්
- වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ ව්‍යාපාරික සම්මන්ත්‍රණ හා හමු, ශාස්ත්‍රීය සංවාද සහ දේශ සීමා අතර පවුලේ උත්සව යනාදිය පැවැත්වීම සඳහා පහසුකම් කුලියට සැපයීම

## දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් එහි බහු මාධ්‍ය පහසුකම ඔස්සේ පහත සේවාවන් සපයනු ලබයි

- සංවර්ධනය වෙමින් සිටින තරුණ විධායකයින් ගෝලීය ප්‍රවණතාවන්ට නිරාවරණය කරන්නා වූ වැඩසටහන්
- බඳවාගැනීම් සහ උසස්වීම් සඳහා පරිගනක පාදක කරගත් විභාග
- ඊ -ඉගෙනුම් භාවිතා කරමින් ඒ ඒ පුද්ගලයින් හෝ කාර්යයන් සඳහා සැකසූ විදේශීය හා දේශීය පුහුණු වැඩසටහන්
- පරිගනක පුහුණුව (පරිගනක පිළිබඳ අත්‍යවශ්‍ය දැනුම (Computer Essentials), ජාත්‍යන්තර පරිගනක ධාවන බලපත්‍රය, ශ්‍රී ලංකා පරිගනක ධාවන බලපත්‍රය, උසස් ඊ -කාර්යාල නිපුණතා යනාදිය)
- ව්‍යාපෘති කළමනාකරණය, ඉදිරිපත් කිරීමේ කුසලතා, ප්‍රකාශන කුසලතා, ඊ ඉගෙනුම් අන්තර්ගතය සංවර්ධන කුසලතා යනාදිය පිළිබඳ පරිගනක පාදක කරගත් පුහුණු
- ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු,මෘදුකාංග ප්‍රවර්ධන කටයුතු සහ පරිගනක පාදක කොටගත් පුහුණු සහ පරිගනක/ අන්තර්ජාලය පාදක කොටගත් විභාග සඳහා අවශ්‍ය පහසුකම් කුලියට සැපයීම

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් එහි පහසුකම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ සේවාවන් ශ්‍රව්‍ය සම්මන්ත්‍රණ මෙන්ම මුහුණට මුහුණලා පැවැත්වෙන පැවැත්වෙන කටයුතු සහ විභාග (පරිගනක පාදක කොටගත් සහ අනෙකුත් විභාග) සඳහා කුලියට සපයනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වෙබ් අඩවියට පිවිසෙන්න

www.dlcsrilanka.org

## මෙයට අමතරව දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පහත සේවාවන්ද සපයනු ලැබේ

- ඊ -ඉගෙනුම් මූලාරම්භයන් සඳහා අවශ්‍ය අන්තර්ගතයන් සකස් කිරීම, පරිවර්තනය සහ ඒවා සංයුක්ත තැටි ලෙස සැකසීම
- කාර්යයන් ලේඛනගත කිරීම (ඩිජිටල් සහ මුද්‍රිත)
- සේවාලාභීන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා සුදුසු අපේක්ෂකයින් බඳවාගැනීම සඳහා විභාග සැලසුම් කිරීම

# 2022 වසරේ පැවැත් වූ ප්‍රධාන වැඩසටහන්

## 1. බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්





බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එහි සහ බස්නාහිර පළාතේ සියලු කලාප අධ්‍යාපන කාර්යාලවල කළමනාකාර සහකාරවරුන් සහ සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් වෙත පවරන ලදී. 2022 වසර තුළ නිලධාරීන් 500 කට වැඩි ප්‍රමාණයක් පුහුණු මාර්ගගත හා භෞතික යන් දෙයාකාරයෙන්ම පැවැත්වෙන වැඩසටහන් 11 ක් පැවැත්වෙනු ඇත.

## 2. මාර්ගගත විභාග







විවිධ සේවාදායකයන් සඳහා මාර්ගගත විභාග පැවැත්වීම තුළ ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ඉදිරියෙන් ම සිටී CIMA, ACCA, සහ CFA යනු එවන් සේවාදායකයන් සමහරකි. ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් විසින් එහි සේවාදායකයන්ට සපයන ආරක්ෂිත වුහාග පරිසරය නිසා තම විභාග පැවැත්වීම සඳහා අප වෙත යොමු වන සේවාදායකයන් බොහොමයකි.

## 3. ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ පැවැත්වීම





2022 වසර තුළ ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ ගණනාවක් පැවැත්වූ අතර තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් සේවාස්ථාන ඵලදායිතාව වැඩි දියුණු කිරීම උසස් පැතුරුම්පත්, රාජ්‍ය ප්‍රසම්පාදනය තුළ ලංසු ඇගයීම සහ රාජ්‍ය ප්‍රසම්පාදනය තුළ සාර්ථක ලංසු කැඳවීම වැනි මාතෘකා ඒ අතර විය. සම්මන්ත්‍රණ මාර්ගගත සහ මාර්ගගත නොවන ආකාරයන්ගෙන් පවත්වනු ලැබීය.

## 4. පද්ධති සහ ජාල පරිපාලනය




අත්‍යවශ්‍ය පද්ධති සහ ජාල පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් හො ප්‍රධානතම වැඩසටහනකි.

## 5. Flutter භාවිතා කරමින් ජංගම යෙදුම් සංවර්ධනය





ජංගම යෙදුම් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් සංවර්ධනය කරන ලද්දක් වන අතර මාර්ගගතව පවත්වන ලදී. එහි සහතික පත් ප්‍රදානය කිරීම යාපනය දිස්ත්‍රික් ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී.

## 6. රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව





නිලධාරීන් 40 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ දින 10 ක පාඨමාලාව පවත්වන ලදී. මෙම වැඩසටහන මාර්ගගත වේදිකාව ඔස්සේ සිදු කරන ලදී.

7. ස්ථානීය පුහුණුව




ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් තම සේවාදායක පරිශ්‍රයන්හිදී අභිරුචි කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වූයේ ය. මාතෘකා කිහිපයක් යටතේ වැඩසටහන් ගණනාවක් සංවිධානය කරන ලදී.

# පසුගිය වසර පහේ මූල්‍ය ප්‍රගතිය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ප්‍රතිඵල සාරාංශය | 2022<br>රු.මිලි. | 2021<br>රු.මිලි. | 2020<br>රු.මිලි. | 2019<br>රු.මිලි. | 2018<br>රු.මිලි. |
|---|---|---|---|---|---|
| පිරිවැටුම | **24.1** | 18.4 | 16.2 | 64.6 | 59.8 |
| වෙනත් ආදායම් | **11.5** | 5.9 | 7.8 | 8.5 | 7.8 |
| මුළු ආදායම | **35.6** | 24.3 | 24.0 | 73.1 | 67.6 |
| මුළු වියදම් | **37.8** | 28.2 | 27.9 | 57.6 | 52.5 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | | | | |
| බදුවලට පෙර | **-2.2** | -3.9 | -3.79 | 15.7 | 15.1 |
| කාර්යමණ්ඩල පිරිවැය | **14.9** | 13.6 | 13.0 | 13.4 | 13.0 |
| කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන | **11** | 11 | 11 | 12 | 12 |

| දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය | 2022<br>රු.මිලි. | 2021<br>රු.මිලි. | 2020<br>රු.මිලි. | 2019<br>රු.මිලි. | 2018<br>රු.මිලි. |
|---|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **142.6** | 142.6 | 142.6 | 142.6 | 142.06 |
| ජංගම නොවන වගකීම් | | | | | |
| ගිවිසුම අනුව රජය විසින් නැවත ගෙවිය යුතුය | **-** | - | - | - | 3.2 |
| ජංගම වගකීම් | **11.9** | 5 | 3.97 | 4.2 | 6.9 |
| මුළු සම කොටස් / වගකීම් | **144.4** | 128.9 | 135.2 | 139.3 | 130.3 |
| කෙටි කාලීන ආයෝජන | **89** | 85 | 78.2 | 68.9 | 84.0 |
| කාරක ප්‍රාග්ධනය | **103.5** | 66.2 | 74.8 | 75.1 | 88.1 |
| මුළු වත්කම් | **142.6** | 128.9 | 135.2 | 139.3 | 130.3 |

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් -PB 192

**2022 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වසර සඳහා සමාගමේ කටයුතු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**

2020දෙසැම්බර් 31 වනදායින් අවසන් වුණු වසර සඳහා වන විගණනය කළ ගිණුම් ප්‍රකාශය සමග අධ්‍යක්ෂ මණ්ඩලය තම වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

**1. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**

සමාගමේ ප්‍රධාන ව්‍යාපාර කාර්යයන් වන්නේ ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිතා කරමින්, විශේෂයෙන් රාජ්‍ය කළමනාකරණය සහ ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන් තුළ ජාත්‍යන්තර විද්වතුන් සමග සම්බන්ධතා පැවැත්වීමේ අවස්ථාවන් ලබාදීමට සහ තොරාතුරු යාවත් කිරීමට රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවකයන් සඳහා වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ අනෙක් කාර්යයන් සංවිධානය කිරීම සහ පැවැත්වීමයි.

**2. අධ්‍යක්ෂවරුන්**

වසර තුළ සමාගම් අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළේ පහත සඳහන් පුද්ගලයන් ය.

අ. නීල් රංජිත් අසෝක කටුවගේ දොන මයා – අධ්‍යක්ෂ
ආ. මිෂෙල් අලීකි ටානියා පෙරේරා මෙය – අධ්‍යක්ෂ
ඇ. කස්තුරි නානායාක්කාරගේ නාලිනි මල්කාන්ති බණ්ඩාර මෙය -
(2022.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)
ඈ. ගීතාංජලී දමයන්ති ප්‍රදීපා මෙය[2]
(2022.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)
ඉ. කරුණානායක තනන්නැහැලාගේ ඉන්දික ප්‍රේමරත්න මයා[1]
(2022.03.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)
ඊ. සෙල්වනාදන් අනෝජන් මයා
(මිෂෙල් අලීකි ටානියා පෙරේරා මෙයට විකල්ප අධ්‍යක්ෂ ලෙස 2022.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)

**සටහන**

1) උදය නිශාන්ත මල්ලවාරච්චි මයා (2022.03.02 සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය)
2) සේරසිංහ පතිරණගේ ගීතාංගනී දමයන්ති ප්‍රදීපා (2022.01.24 දින පත් කරන ලද අතර 2023.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය)

**3. මූල්‍ය ප්‍රකාශය**

සමාගමේ මූල්‍ය ප්‍රකාශය වාර්ෂික වාර්තාව තුළ දක්වා ඇත.

**4. විගණක වාර්තාව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණක වාර්තාව, වාර්ෂික වාර්තාව තුළ දක්වා ඇත.

**5. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට සටහන්**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වාර්ෂික වාර්තාව තුළ දක්ව ඇති අතර භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති තුළ කිසිදු ද්‍රව්‍යාත්මක වෙනසක් සිදු වී නැත.

## 6. සම්බන්ධතා පිළිබඳ ලේඛනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 192 වන වගන්තිය අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වා ගෙන යනු ලබයි.

## 7. අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් සම්බන්ධතා

වසන්තා පෙරේරා මෙය, සහ කේ.ඒ.රම්‍යා කාන්ති මෙය යන අධ්‍යක්ෂවරුන්, මූල්‍ය ප්‍රකාශයට වන 22 වන සටහන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ සමාගමේ ගිවිසුම්වලට සම්බන්ධතා දක්වා නොමැත.

## 8. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ

අධ්‍යක්ෂවරුන් සඳහා මණ්ඩල රැස්වීම් සහ විගණන කමිටු සඳහා පැමිණීමේ ගාස්තු සහ සභාපති වෙත ගෙවන දීමනා මූල්‍ය ප්‍රකාශනවල සටහන 08 ප්‍රකාරව ගෙවනු ලැබීය.

## 9. අධ්‍යක්ෂවරුන් / වරින් වර නැවත පත් කිරීම

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයට පත් කරන ලද පහත අධ්‍යක්ෂවරුන් වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව නැවත පත් කිරීමට යෝග්‍ය වේ.

අ) කස්තුරි නානායක්කාරගේ නාලනී මල්කාන්ති බණ්ඩාර මෙය (2022.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)
ආ) ගීතාංගනී දමයන්ති පෙරේරා මෙය (2022.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)
ඇ) උදය නිශාන්ත මල්ලවාරච්චි මෙය (2022.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය)
ඈ) කරුණානායක තනන්නැහැලාගේ ඉන්දික ප්‍රේමරත්න මයා (2022.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)
ඉ) සෙල්වනාදන් අනෝජන් මයා (මිෂෙල් අලීකි ටානියා පෙරේරා මෙයට විකල්ප අධ්‍යක්ෂ ලෙස 2022.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

## 10. දේපළ පිරියත සහ උපකරණ

වසර තුළ දේපළ පිරියත සහ උපකරණ මූල්‍ය ප්‍රකාශන තුළ 12 වන සටහන තුළ දක්වා ඇත.

## 11. ශේෂ පත්‍ර දිනයට පසුව සිදු වූ සිදුවීම්

වාර්තාකරණ දිනය අතර මූල්‍ය  ප්‍රකාශනවල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය සිදුවීම් සිදුව නොමැත.

## 12. සංස්ථානික පාලනය

රජය සතු ව්‍යාපාර සඳහා වන සංස්ථානික පාලනය පිළිබඳ සංස්ථානික පාලන මාර්ගෝපදේශය සමග සමාගම අනුගත වන බවට මණ්ඩලය වග බලාගෙන ඇත.

## 13. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් තම දැනුමේ ප්‍රකාරව, රජයට ගෙවීමට නියමිත සියලුම ගෙවීම්, ලද හැකි මූල්‍ය හැකියාවන් මත ගෙවා ඇති බවට සෑහීමකට පත්වේ.

## 14. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැඳීම් වන අතර සමාගමේ පාලනයෙන් ඔබ්බට පවතින අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇතිවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු වේ.

**15. විගණකවරු**

සමාගමේ වර්තමාන විගණකවරුන් වන්නේ ජාතික විගණන කාර්යාලය වන අතර පැමිණෙන වාර්ෂික මහ සභා රැස්වීමේදීද සමාගම් විගණකවරු ලෙස පත් වෙනු ඇත.

මූල්‍ය වසර සඳහා වන වාර්ෂික විගණක ගාස්තුව රු 269,100/ වන අතර ගෙවීම සිදු කළ යුතුව ඇත.

**16. වාර්ෂික මහා සභා රැස්වීම**

සමාගමේ වාර්ෂික මහසභා රැස්වීම 2023 මැයි 29 වන අඟහරුවාදා දින ප.ව. 2.00 ට අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07 හිදී පැවැත්වෙනු ඇත.

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි**

**අකවුන්ටින්ග් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් පුද්ගලික සමාගම**

**ලේකම්වරු**

අත්සන් කළා
..............................
**සභාපති**

අත්සන් කළා
..............................
**අධ්‍යක්ෂවරු**

අත්සන් කළා
..............................
**ලේකම්වරු**

**දිනයඃ** 2023 මැයි 23

# බාහිර විගණකවරයාගේ වාර්තාව

සභාපති
ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් හි 2022 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ සහ අනෙකුත් නීති රෙගුලාසි සම්බන්ධව 2018, අංක 19 දරන මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශ**

1.1 **මතය**

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ආයතනයේ 2020 දෙසැම්බර් 31 වන දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධාන යටතේ විගණනය කරන ලදී. මාගේ වාර්තාව ව්‍යවස්ථාවේ අංක 154(6) අංශයන්හි නියාමන විධිවිධාන අනුගමනය කරමින් නියමිත දිනවකවානු වලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

මාගේ මතය අනුව මෙම වාර්තාවේ අඩංගු තත්වගණනය කල මතයන්හි ඉදිරිපත් කර ඇති යම් සුවිශේෂී කරුණු සහ එහි බලපෑම් හැරුණු විට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම සමාගමේ මූල්‍ය තත්ත්වය කුඩා සහ මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දේ.

1.2 **මතය සඳහා පදනම**

මාගේ විගණන වාර්තාව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව සිදු කර ඇත. එම ප්‍රමිතීන් හා සම්බන්ද මා සතු වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන කොටසේ විගණනකගේ වගකීම් යටතේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්වගණනය කල මතයෙහි පදනම සඳහා අවශ්‍ය තරම් නිවැරදි තොරතුරු සහ විගණන සාක්ෂි මම විසින් ලබාගෙන ඇති බව විශ්වාස කරමි.

1.3 **සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙක් තොරතුරු**

අනෙකුත් තොරතුරුවලට සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු අයත් වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ මෙම විගණකාධිපති වාර්තාවට පෙර ඒ පිළිබඳව මගේ වාර්තාව අයත් නොවේ. කළමනාකාරීත්වය වෙනත් තොරතුරු සඳහා වග කියනු ලබයි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ අදහස අනෙක් තොරතුරු ආවරණය නොකරන අතර එහි නිගමනයන් පිළිබඳව මම කිසිදු සහතියකක් ලබා නොදෙන්නෙමි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධම් මගේ විගණනයට අනුව මගේ වගකීම වන්නේ එය මට ලබා දුන් පසුව ඉහත හඳුනාගත් තොරතුරු කියවීම සහ කියවීමේදී හෝ මගේ දැනුමේ ප්‍රකාරව එම අනෙකුත් තොරතුරු මූල්‍ය

ප්‍රකාශනවලට ද්‍රව්‍යාත්මක ලෙස අනනුකූල වන්නේද හෝ වෙනත් අයුරකින් ඒවා ද්‍රව්‍යාත්මකව වැරදි අයුරින් දක්වා ඇතිද යන්න සලකා බැලීම යි.

සමාගමේ 2022 වාර්ෂික වාර්තාව කියවීමේදී එහි ද්‍රව්‍යාත්මක අවප්‍රකාශයන් ඇති බවට මා විසින් නිගමනය කෙරෙන්නේ නම් මා එය නිවැරදි කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් පාලනාධිකාරීන්ට දැන්විය යුතු වෙයි. තවදුරටත් අවප්‍රකාශයන් පවතින්නේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 :6* තුළ ඇති විධි විධාන අනුව මා ඒවා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන වාර්තාවට ඒවා ඇතුළත් කළ යුතු වේ

## 1.4 කළමනාකාරීත්වයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන හා සම්බන්ධ පාලනාධිකාරී බලතල ඇති අය පිලිබඳ වගකීම්

කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් සහිත මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීම සම්බන්දව කළමනාකාරිත්වය වග වියයුතු අතර එවැනි මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීමේදී ඒවා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වියයුතු බවට කළමනාකාරිත්වය නිවරදිව තහවුරු කරගත යුතුය.

මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීමේදී, කළමනාකාරිත්වය විසින් ව්‍යාපාරය ඈවර කිරීමට හෝ සම්පුර්ණයෙන් අත්හිටුවීමට හෝ වෙනත් යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී හැර අදාල සමාගම සතු ලාභදායි ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගැනීමේ හැකියාව සහ අවශ්‍ය පරිදි කරුණු හෙළිදරවු කිරීම ඇතුළු ලාභදායි ව්‍යාපාරයක් සම්බන්ද තොරතුරු සහ එහි ගිණුම්කරණ පදනම තක්සේරු කිරීමට කළමනාකාරීත්වය වගවිය යුතුය.

වගකීම් පැවරී ඇති අය සමාගමේ මූල්‍ය තොරතුරු සම්පාදනය කිරීම පිලිබඳ වගවිය යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 16 (1) කොටසට අනුරූපව ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්දව නිවැරදි පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට සහ ඒ හරහා වාර්ෂික සහ කලාවර්තිත මූල්‍ය තත්ත්ව වාර්තා සම්පාදනය කිරීමට අදාල සමගම සමත්විය යුතු යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකගේ වගකීම්

මාගේ විගණනය මත පදනම්ව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර, වංචා හෝ වැරදි අන්තර්ගත නොවන සාධාරණ තහවුරුවක් ලබාදිය හැකි, එමෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ මතය ද සහිත විගණන වාර්තාවක් ලබාදීම අරමුණ වේ. සාධාරණ තහවුරුවක් ලබා දී තිබීම පමණක් වුවද යම් ඉහල මට්ටමක තක්සේරුවක් පිලිබඳ අදහසක් ඇති කලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව සිදුකෙරෙන විගණනයන්හි දී වුව ද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් මගහැරීම සිදුවියහැක. සාවද්‍ය ප්‍රකාශයන් වංචා හෝ වැරදීම් වල ප්‍රතිඵලයන් ලෙස ඇතිවිය හැකි අතර ඒවා ප්‍රමාණාත්මක වීමට තනි තනිව හෝ එකතුවක් වශයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශන මත ගනු ලබන වාණිජමය තීරණ සඳහා බලපෑම් කල යුතුය.

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව මෙම විගණනය සිදු කර ඇති අතර එම සමස්ත විගණන ක්‍රියාවලිය තුල අවශ්‍ය වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සන්දේහවාදය පවත්වා ගන්නා ලදී. එසේම:

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්හි වංචා සහගත හෝ වැරදි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම, එම තත්ත්වයන්ට සංවේදී විගණන ක්‍රියා පටිපාටීන් ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම, එමෙන්ම මාගේ මතය සඳහා වන පදනම වෙනුවෙන් වූ විගණන සාක්ෂි එකතු කිරීම. වංචාව නිසා සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් නිවැරදිව ග්‍රහණය කර නොගැනීම වැරදීමක් නිසා සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හරහා සිදුවන හානියට වඩා බරපතල වනුයේ ඒවා දුස්සන්ධාන, ව්‍යාජ අත්සන් යෙදීම, අභිප්‍රයික පැහැර හැරීම, ව්‍යාජ පෙනීසිටීම් හෝ අභ්‍යන්තර පාලනයන් නොසලකා කටයුතු කිරීම වැනි තත්වයන් සමඟ බැඳී ඇති හෙයිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයන් පිලිබඳ අවබෝධයක් ඇතිකර ගැනීම වැදගත් වනුයේ එම අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිතාව පිලිබඳ මතයන් ඉදිරිපත් කිරීමට නොව, එම සමාගම්වලට අනුරූපව විගණන ක්‍රියාපටිපාටීන් සම්පාදනය කරගැනීමටය.

- කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ තක්සේරු වාර්තාවල සාධාරණත්වය සහ අනාවරණයන් ඇගයීමට ලක් කිරීම.

- සුදුසුතාවය මත කළමනාකරණය භාවිතාව තුලින්, ගිණුම්කරණය මත පදනම් වූ විගණන සාක්ෂි මත පිහිට අඛණ්ඩව ලාභ ලබන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට සමාගම සතු හැකියාව අභියෝගයට ලක්කෙරෙන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පැවතීම නිශ්චය කරන්න. එවැනි ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් ඇති බවට මා විසින් නිගමනය කරන ලද අවස්ථාවන් වලදී ඒ පිලිබඳ මාගේ විගණන වාර්තා තුලින් අදාළ මූල්‍ය තත්ව වාර්තා ප්‍රකාශනයන් සඳහා කරුණු ඉදිරිපත් කිරීමටත්, මාගේ මතය ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී සංශෝදන ඉදිරිපත් කිරෙමටත් කටයුතු කෙරෙනු ඇත. මාගේ නිගමනයන් විගණන වාර්තා සම්පාදනය කරන ලද අවසාන දිනය දක්වා එකතු කරන ලද විගණන සාක්ෂි මත පදනම් වන අතර තවදුරත් සිදුවන ක්‍රියාකාරකම් සහ සිදුවීම් සමගම ලාභ ලබන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගෙන යෑම අඩපන කිරීමට හේතු විය හැක.

- කරුණු අනාවරණය කිරීම ඇතුළු මූල්‍ය තත්ත්ව ප්‍රක්ෂනවල ව්‍යුහය, සමස්ථයක් වශයෙන් ගත විට කරුණු ඉදිරිපත් කිරීම සහ මූල්‍ය තත්ත්ව වාර්තා හරහා අදාල ගනුදෙනු හා ක්‍රියාකාරකම්වල සාධාරණ කරුණු ඉදිරිපත් කිරීමක් ඇති බව ඇගයීමට ලක් කර ඇත.

මූල්‍ය විගණන ක්‍රියාපටිපාටිය අතරතුර අභ්‍යන්තර පරිපාලන දුර්වලතා ඇතුළු අනෙකුත් විගණනය ආශ්‍රිත සොයාගැනීම් පිලිබඳ පාලනාධිකාරී බලතල සහිත අංශ සමඟ මනා අවබෝධයක් සහිතව කරුණු හුවමාරු කරගැනීමට කටයුතු කරන ලදී.

**2. නෛතික සහ අනෙකුත් නියාමනයන් සම්බන්ධ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 2007 අංක 07 දරන සමාගම් පනත පහත සඳහන් කරුණු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත.

2.1.1 තත්වගණනය කල මතය සඳහා වූ පදනම හරහා කරුණු දක්වා ඇති ගැටළු සහ ඒවායේ බලපෑම් හැරුණු විට මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු කරුණු සහ පැහැදිලි කිරීම්

එක්රැස් කරගන්නා ලදී. එසේම එම කරුණු සහ පැහැදිලි කිරීම් ඉතා සාධනීය ලෙස මාගේ වාර්තා තුල යොදාගෙන ඇති අතර එම කරුණු සහ පැහැදිලි කිරීම් පවත්වාගෙන යාම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 163 (1) (d) කොටසේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (a) කොටසේ දැක්වෙන ප්‍රතිපාදන වලට අනුරූපව සමාගම විසින් පවත්වාගෙන යෑම සිදුකර ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි අංක 6 (1) (d) (iii) කොටසේ දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූල වේ.

2.1.3 පසුගිය වසර සඳහා මා විසින් සම්පාදනය කල සියලු නිර්දේශයන් ඇතුලත් මූල්‍ය ප්‍රකාශ 2018 අංක 19 ජාතික විගණන පනතෙහි 6 (1) (ා) (ඝඩ) කොටසේ ප්‍රතිපාදනවලට අනුරූපව සිදුකර ඇත.

2.2 සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් සහ ලබාගන්න ලද සාක්ෂි අනුව, පැවති තත්වයන් සියල්ල ප්‍රමාණාත්මක වන අතර අන් කිසිදු තත්වයක් මාගේ විශේෂ අවධානයට යොමු නොවුනි.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (d) කොටසේ ප්‍රතිපාදනවලින් බැහැරව සමාගමේ පරිපාලන ව්‍යුහයේ සාමාජිකයකු ඍජුව හෝ වක්‍රව සිදුකරනු ලබන මැදිහත් වීම් හරහා ලබාගන්නා ලද කොන්ත්‍රාත්තු පිලිබඳ සඳහන් කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) කොටසේ ප්‍රතිපාදනවලට අනුරූපව සමාගමේ පාලන ව්‍යුහය විසින්ඉදිරිපත් කර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන වලට අමතරව සමාගම විසින් වෙනත් කිසිදු ලිඛිත නීතියක් සම්පාදනය නොකිරීම.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (g) කොටසේ ප්‍රතිපාදන අනුව සමාගම එහි බලතල කාර්යයන් සහ වගකීම් අනුව කටයුතු නොකිරීම

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (h) කොටසේ ප්‍රතිපාදන අනුව අදාළ නීති සහ කාලරාමුවලට අනුගතව සමාගම ප්‍රසම්පාදනය නොකිරීම ආර්ථිකමය ලෙස ඵලදායි ලෙස සහ කාර්යක්ෂම ලෙස උපයෝජනය නොකිරීම

2.3 වෙනත් කරුණු

(අ) වසරේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු වැඩසටහන්වලින් සහ වෙනත් ක්‍රියාකාරකම්වලින් ඉපයීමට අපේක්ෂිත අදායම රු 58,111,029 ක් වුවද, එමගින් උපයා ඇත්තේ සියයට 41 ක් හෙවත් රු 24,067,890 ක් පමණි. සමාලෝචිත වර්ෂය තුළ නව වැඩසටහන්ල ප්‍රාදේශීය පුහුණු සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුව තිබුණේ වුවද එය සිදු කර නොමැත

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වත්කම් සත්‍යායන වාර්තාව ඉදිරිපත් කර නොමැත

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

State Owned Institute Under
Ministry of Public Administration

DLC
Distance Learning Centre Ltd.
Connecting Minds

# විගණනය කළ

# මූල්‍ය ප්‍රකාශය

# 2022

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු: | රු: |
| ආදායම | 04. | 24,067,890 | 18,486,551 |
| විකුණුම් පිරිවැය | 05. | (5,735,779) | (4,032,854) |
| **දළ ලාභය** | | 18,332,111 | 14,453,696 |
| වෙනත් ආදායම් | 06. | 1,896 | 18,843 |
| බෙදාහැරීමේ වියදම් | 07. | (129,919) | (156,769) |
| පරිපාලන වියදම් | 08. | (31,924,728) | (24,077,354) |
| ශුද්ධ මූල්‍ය ආදායම | 09. | 11,523,357 | 5,898,049 |
| **ආදායම් බදුවලට පෙර ලාභය/(පාඩුව)** | | (2,197,283) | (3,863,535) |
| ආදායම් බදු ඉතුරුම්/ ගෙවීම | 10. | (2,053,051) | (4,242,261) |
| **වසරේ ලාභය/ (අලාභය)** | | (4,250,333) | (8,105,796) |
| **කොටසකට ඉපයුම** | 11. | (0.30) | (0.57) |

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.

*වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.*

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

**මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය**

| දිනට | සටහන | 31.12.2022<br>රු: | 31.12.2021<br>(නැවත ප්‍රකාශ කර ඇත)<br>රු: |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 12 | **10,714,416** | 1,645,846 |
| මූල්‍ය ආයෝජන | 13 | **-** | 28,936,610 |
| බදු කුලිය | 14 | **16,550,585** | 18,205,644 |
| විලම්භිත බදු වත්කම් | 15 | **1,640,109** | 3,693,160 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **28,905,111** | 52,481,261 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 16 | **9,560,046** | 8,653,517 |
| වෙනත් මූල්‍ය වත්කම් | 13 | **89,256,969** | 55,377,594 |
| අයකරගත යුතු ජංගම බදු | 17 | **4,620,752** | 4,620,751 |
| මුදල් හා මුදල් සමාන දෑ | 18 | **12,081,578** | 7,844,528 |
| **මුළු ජංගම වත්කම්** | | **115,519,345** | 76,496,390 |
| | | | |
| **මුළු වත්කම්** | | **144,424,456** | 128,977,651 |
| | | | |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ස්කන්ධ** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 19 | **142,065,090** | 142,065,090 |
| සමුච්චිත ලාභය/(අලාභය) | | **(26,382,989)** | (22,132,656) |
| වත්කම් නැවත තක්සේරු කිරීම | | **12,225,904** | - |
| **මුළු ස්කන්ධ** | | **127,908,006** | 119,932,434 |
| | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 20 | **4,587,720** | 3,964,345 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **4,587,720** | 3,964,345 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 21 | **3,619,861** | 3,348,003 |
| ලැබුණු අත්තිකාරම් | 22 | **6,888,000** | 312,000 |
| ගෙවිය යුතු ආදායම් බදු | | **1,420,869** | 1,420,869 |
| **මුළු ජංගම බැරකම්** | | **11,928,730** | 5,080,872 |
| | | | |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | **144,424,456** | 128,977,651 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

| | |
|---|---|
| ..................... | ........................... |
| **මූල්‍ය කළමනාකරු** | **ප්‍රධාන විධායක නිලධාරී** |

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.
ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත.

| | | |
|---|---|---|
| .................. | .................. | .................. |
| **සභාපති** | **අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ** |

මූල්‍ය  ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.
*වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.*

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධන රු: | සමුච්චිත ලාභය/(අලාභය) රු: | ප්‍රත්‍යාගණන සංචිතය රු: | එකතුව ස්කන්ධ |
|---|---|---|---|---|
| 2021 ජනවාරි 1 වන දිනට ශේෂය | 142,065,090 | (14,206,542) | - | 127,858,548 |
| පූර්ව වසර ගැලපුම් | - | 179,683 | - | 179,683 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | (8,105,796) | - | (8,105,796) |
| 2021 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 142,065,090 | (22,132,656) | - | 119,932,434 |
| **2022 ජනවාරි 1 වන දිනට ශේෂය** | **142,065,090** | **(22,132,656)** | **-** | **119,932,434** |
| **වත්කම් නැවත තක්සේරු කිරීම** | **-** | **-** | **12,225,904** | **12,225,904** |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **-** | **(4,250,333)** | **-** | **(4,250,333)** |
| **2022 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **142,065,090** | **(26,382,989)** | **12,225,904** | **127,908,005** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.

*වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.*

**පූර්ව වසර ගැලපුම් 2021**

| | |
|---|---|
| ස්ථාවර තැන්පතුවල ආරම්භක ශේෂ වෙනස නිවැරදි කිරීමෙන් | 205,891 |
| ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂ වෙනස නිවැරදි කිරීමෙන් | (26,208) |
| | **179,683** |

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

| | 2022<br>රු: | 2021<br>රු: |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | |
| ආදායම් බදුවලට පෙර ලාභය/(පාඩුව) වියදම් | **(2,197,283)** | (3,863,535) |
| | | |
| **ගැලපුම්** | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම | **3,188,666** | 1,438,769 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **623,375** | 526,700 |
| බදු කුලී ක්‍රමක්ෂය | **1,655,059** | 1,655,059 |
| පොලී ආදායම | **(11,552,432)** | (5,920,289) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **(8,282,615)** | (6,163,296) |
| | | |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම | **(906,529)** | (1,968,182) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම | **271,858** | (62,325) |
| ලැබුණු අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | **6,576,000** | (255,190) |
| | **(2,341,286)** | (8,448,993) |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | | |
| ගෙවූ ආර්ථික සේවා ගාස්තු | **-** | - |
| ගෙවූ රඳවා ගැනීමේ බදු | **-** | - |
| රජයේ ණය සඳහා ගෙවූ පොළිය | **-** | - |
| ආදායම් බදු | **-** | - |
| ***මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (භාවිතා කළ) ශුද්ධ මුදල්*** | **(2,341,286)** | (8,448,993) |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | **(31,331)** | (121,765) |
| ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය | **(46,553)** | - |
| ලැබූ පොළිය | **6,656,219** | 101,667 |
| ***ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්*** | **6,578,336** | (20,098) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| වසර තුළ නැවත ගෙවූ ණය | **-** | - |
| ***මූල්‍ය ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්*** | **-** | - |
| | | |
| **මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම** | **4,237,050** | (8,469,092) |
| වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | **7,844,528** | 16,313,620 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමානදෑ (සටහන අ )** | **12,081,578** | 7,844,528 |

| සටහන අ- මුදල් හා මුදල් සමාන දෑ | **As at 31.12.2022** | As at 31.12.2021 |
|---|---|---|
| බැංකුවල මුදල් - ලංකා බැංකුව: ගිණුම් අංක. 0002323189 | **349,770** | 225,315 |
| අතැති මුදල් | **25,000** | 25,000 |
| අරමුදල් කළමනාකරණ ගිණුම | **3,706,808** | 7,594,213 |
| ඇමතුම් තැන්පතු - ලංකා බැංකුව | **8,000,000** | - |
| | **12,081,578** | 7,844,528 |

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.

*වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.*

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2021

1. වාර්තාකරන අස්තිත්වය

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත මෙන්ම එහි නිත්‍ය වාසය කොටගත් රජයේ සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07 ලිපිනයෙහි පිහිටා තිබේ.

ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිතා කොට විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණය සහ ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ විශේෂඥයින් සමග අන්තර් ක්‍රියාකාරීත්වය ඇතිකරගැනීම සඳහා යාවත්කාලීන තොරතුරු සහ අවස්ථාවන් වෙත ප්‍රවේශය ලබාගැනීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ සේවකයින් සඳහා පහසුකම් ලබාදීම වෙනුවෙන් වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ අනෙකුත් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ පැවැත්වීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ.

2. සකස් කිරීම සඳහා පදනම

2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව හා 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුව සකස් කරන ලද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති යනාදිය සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත වේ.

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන.

2.2 මැනුම් සඳහා පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පදනම්ව සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම් ඇති කෙරෙන උද්ධමන සාධක සඳහා ගැළපුම් රහිතව ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ලෙස යොදාගනු ලැබේ.
පූර්වේක්ෂ්‍ය අනාගතයේදී ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමාගම සතු හැකියාව පිළිබඳ ඇගයීමක් අධ්‍යක්ෂකවරුන් විසින් සිදු කොට ඇති අතර එයට අනුව ක්‍රියාකාරකම් ඇවරකිරීම හෝ අවසන් කිරීම සඳහා අවශ්‍යතාවක් ඔවුන් දකින්නේ නැත.

2.3 කාර්යබද්ධ සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ කාර්යබද්ධ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී , ගිණුම්කරන ප්‍රතිපත්ති යොදාගැනීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම්වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපානු ලබන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට සිදුවේ.

ඉතිහාසය පිළිබඳ අත්දැකීම් සහ ඒ ඒ වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදු කෙරේ. එබැවින් සත්‍ය ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වන උපකල්පන අඛණ්ඩව සිදු කෙරෙන පදනමින් සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලසීමාව තුළදී සහ බලපෑමට ලක්වන ඕනෑම ඉදිරි කාලසීමාවන් තුළදී හඳුනාගැනේ.

## 3. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර තිබෙන සියලු කාල පරිච්ඡේද සඳහා සංගත ලෙස යොදා ගෙන ඇත. එහි අරමුණ වනුයේ, නිශ්චිත වශයෙන් දක්වා ඇති අවස්ථාවන් හැර කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති වෙත පරිවර්තනය කිරීම සඳහාය.
අස්තිත්වය විසින් ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ලෙස යොදා ගෙන ඇත.

### 3.1 විදේශ මුදල් ගණුදෙනු

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අස්තිත්වයේ කාර්යබද්ධ ව්‍යවහාර මුදල් හැර අනෙකුත් ව්‍යවහාර මුදල්වලින් (විදේශ මුදල්) සිදුකෙරෙන ගණුදෙනු, එම ගණුදෙනු සිදුකෙරෙන දිනවලදී පවතින විනිමය අනුපාතික භාවිතා කොට කාර්යබද්ධ ව්‍යවහාර මුදලින් වාර්තා කෙරේ.

සෑම වාර්තාකරන දිනයකදීම, විදේශ මුදල්වලින් ඉදිරිපත් කෙරෙන මූල්‍ය අයිතම පියවුම් අනුපාතිකයට අනුව පරිවර්තනය කෙරේ. සාධාරණ වටිනාකමට අනුව මිනුම් කරන ලද මූල්‍යමය නොවන අයිතම, සාධාරණ වටිනාකම තීරණය කරන ලද දිනයේ පවතින අනුපාතිකවලට අනුව පරිවර්තනය කෙරේ. ඓතිහාසික පිරිවැය අනුව මිනුම් කරන ලද මූල්‍යමය නොවන අයිතම ගණුදෙනු සිදු කෙරෙන දිනවල පවතින අනුපාතිකවලට අනුව පරිවර්තනය කෙරේ.

මූල්‍ය අයිතම බේරුම් කිරීම් සහ මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින විනිමය අන්තරය, කාල පරිච්ඡේදය සඳහා වන ලාභ හෝ පාඩු තුළ අන්තර්ගත කෙරේ.

සාධාරණ වටිනාකම දරන මූල්‍යමය නොවන අයිතම පරිවර්තනය මත පැන නගින විනිමය අන්තරයන් කාල පරිච්ඡේදය සඳහා වන ලාභ හෝ පාඩු තුළ අන්තර්ගත කෙරෙන අතර අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගැනෙන අන්තරයන් මෙහිදී බැහැර කෙරේ.

### 3.2 වත්කම් සහ ඒවායේ තක්සේරුව සඳහා පදනම් වන කරුණු

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් යනු මුදල්, බැංකු ශේෂ සහ සමාගමේ හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය අතරතුර හෝ වාර්තාකරන දින සිට වසරක් ඇතුළත හෝ යන දෙකෙන් කෙටි කාලය තුළ මුදලින් උපලබ්ධි කිරීමට අපේක්ෂා කෙරෙන දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ වාර්තාකරන දින සිට වසරක කාලයකට එහා සමාගම විසින් තබා ගැනීමට අදහස් කරනු ලබන දෑ වේ.

### 3.2.1 දේපළ, පිරියත හා උපකරණ

#### 3.2.1.1 හඳුනාගැනීම හා මිනුම් කිරීම

දේපළ, පිරියත හා උපකරණ, පිරිවැය අඩු කරන ලද සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි අලාභ වලදී ප්‍රකාශ කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක තිබෙන කොටස් විවිධ ආයු කාලවලින් ප්‍රයෝජනයට ගත හැකි වන්නේ නම්, ඒවා දේපළ, පිරියත සහ උපකරණ වෙන වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගැනේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් නිශ්කාෂණය කිරීමෙන් වන ලාභ හා පාඩු, නිශ්කාෂණය කිරීමෙන් ලැබෙන මුදල්, දේපළ, පිරියත හා උපකරණවල ධාරණ ප්‍රමාණය සමග සන්සන්දනය කිරීමෙන් තීරණය කෙරෙන අතර අනෙකුත් ආදායම තුළ ලාභ හෝ පාඩු වල ශුද්ධ අගයක් ලෙස හඳුනාගැනේ.

#### 3.2.1.2 ක්ෂය

වත්කමක පිරිවැය හෝ පිරිවැය සඳහා ආදේශ කරන අනෙක් ප්‍රමාණය (එහි අවශිෂ්ට වටිනාකම රහිතව) වන ක්ෂය විය හැකි ප්‍රමාණය මත ක්ෂය ගණනය කෙරේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක ඒ ඒ කොටසේ ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයන් මත සරල රේඛීය පදනමකින් ක්ෂයවීම් ලාභ හෝ පාඩු තුළ හඳුනාගැනේ. ඒ, මෙය, වත්කම තුළ ගැබ්ව පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂිත රටාව ඉතා සමීපව පිළිබිඹු කරන බැවිනි.

වත්මන් සහ සාපේක්ෂ කාල පරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයන් පහත පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය (වසර) | ක්ෂයවීමේ ශීඝ්‍රතාව (%) |
|---|---|---|
| පරතරයන් අවම කිරීමේ හා ඉගැන්වීමේ උපකරණ | 5 | 20 |
| පරිගනක උපකරණ | 4 | 25 |
| කාර්යාල උපකරණ | 5 | 20 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 5 | 20 |

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය භාවිතයට ගැනීමට ලැබෙන අවස්ථාවේදී වන අතර වත්කමක ක්ෂයවීම නතර වනුයේ වත්කම, අලෙවිය සඳහා රඳවාගත් යනුවෙන් වර්ගීකරණය වන දිනය සහ වත්කම වත්කමක් ලෙස හඳුනා නොගැනෙන දිනය යන දෙකෙන් කලින් එළැඹෙන දිනයේ වේ.

ක්ෂයවීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය සහ අවශිෂ්ට වටිනාකම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කෙරෙන අතර සුදුසු නම්, ගැලපුම් කෙරේ.

### 3.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙන වගකීම් යනු, ඉල්ලූ විට හෝ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරක් ඇතුළත හෝ ගෙවිය යුතු වන ගෙවීමය. ජංගම නොවන වගකීම් යනු, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වන ශේෂයන් වේ. හඳුනාගත් සියලු වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගණන් ගැනී ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන්, විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතුව වර්තමානයේ පවතී නම් සහ එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යෑමක් අවශ්‍ය විය හැකි වන්නේ නම් එහිදී ප්‍රතිපාදනයක් හඳුනාගැනේ.

### 3.3.1 සේවක ප්‍රතිලාභ

#### 3.3.1.1 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ යම් අස්තිත්වයක් විසින් වෙනම අස්තිත්වයක් වෙත ස්ථාවර දායකත්ව මුදලක් ගෙවනු ලබන අතර ඉන් ඉදිරියට වෙනත් කිසිදු මුදලක් ගෙවීමට නෛතික හෝ සම්මුතික බැඳීමක් එම අස්තිත්වයට ඇත්තේ නැත. නිශ්චිත දායකත්ව විශ්‍රාම වැටුප් සැලසුම් වෙත දායක වීම සඳහා වන බැඳීම්, සේවකයින් විසින් සේවාවන් සපයනු ලබන කාල සීමාවන් තුළදී සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ පාඩු තුළ හඳුනාගැනේ.

සේවකයින්ගේ දළ පඩිනඩි වලින් 12%ක් සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදල වෙත දායක කෙරේ.

සියලුම සේවකයින් සේවක භාර අරමුදල සඳහා සුදුසුකම් ලබන අතර එම සේවකයින්ගේ දළ පඩිනඩිවලින් 3%ක් සමාගම විසින් එම අරමුදලට දායක කෙරේ.

#### 3.3.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මකට පරිබාහිර වූ පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ, වත්මන් සහ පෙර සිටි සේවකයින් වෙත ගිවිසි ප්‍රතිලාභය ලබාදීමට අස්තිත්වය බැඳී සිටී.

වත්මන් සේවකයින් විසින් අනාගතයේ කරනු ලබන සේවාවන් නොසලකා හැරීම, ඇස්තමේන්තු කරන ලද අනාගත වැටුප් වැඩිවීම් නොසලකා හැරීම සහ වාර්තා කරන දිනය සහ සේවකයින් පශ්චාත් සේවක ප්‍රතිලාභ ලැබීම ඇරඹීමට අපේක්ෂිත දිනය අතර වත්මන් සේවකයින් සේවයේ යෙදී සිටියදී සිදුවිය හැකි මර්ත්‍යතාව නොසලකා හැරීම යනාදී වශයෙන් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති- "සේවක ප්‍රතිලාභ" හි 28 වන වගන්තිය මගින් අවසර ලබා දී ඇති සරලකිරීම භාවිතා කොට සේවය අරඹන දිනයේ සිට සේවය කරන සෑම වසරක් සඳහාම ආයුගණක තක්සේරුකරණය රහිතව අඩ මසක වැටුපට, නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සඳහා සමාගමේ ශුද්ධ බැඳීම ගණනය කෙරේ.

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති - "සේවක ප්‍රතිලාභ" හි 28 වන වගන්තියට අනුකූලව සියලු සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා විවිධාන සලසා ඇත. කෙසේවුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයෙකු වෙත පාරිතෝෂිකය ගෙවීම සඳහා වන බැඳීම මතු වනුයේ සේවකයා විසින් වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණක් වන අතර සේවක සංඛ්‍යාව 15 ට වඩා අඩු නම්, එවැනි සේවකයින් සඳහා පාරිතෝෂිකය ගෙවීම විධානාත්මක නොවේ. බැඳීම බාහිරව අරමුදල් සැපයෙන්නකි.

### 3.3.2 ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිතතාවන්

අවිනිශ්චිතතාවන් යනු පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇති වූ දේපළ හෝ බැඳීම් විය හැකි අතර ඒවා තහවුරු වන්නේ සමාගමේ පාලනයෙන් බැහැර වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත පමණි.

#### 3.3.2.1 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය මගින් සමාගමේ කාර්යසාධනයෙහි ලක්ෂණ සාධාරණව ඉදිරිපත් කරන බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 3 කොටසෙහි ප්‍රතිපාදනවලට එනම් "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" අනුව යොදා ගැනෙන බවයි.

### 3.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික වාසි ලැබෙන ලෙස සහ ආදායම හා දැනටමත් දරා ඇති හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැන ගැනීමට හැකි වන ලෙස ආදායම් හඳුනා ගැනේ. සංශෝධිත හෝ සංශෝධනය කළ හැකි ගෙවීම්හි සාධාරණ අගය, ශුද්ධ වෙළඳ වට්ටම් හා ආදායමට අදාළ බදු අනුව ආදායම මැන බලනු ලැබේ. ආදායම් හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන නිශ්චිත වූ නිර්ණායක යොදා ගනු ලැබේ.

#### 3.4.1.1 සේවාවන් සැපයීම

සේවාවන් සැපයීමට අදාළ ගණුදෙනු තුළින් ලැබෙන ආදායම වාර්තා කිරීමේ කාලය අවසානයේ ගණුදෙනුව සම්පූර්ණ කිරීමේ අදියරට අදාළව හඳුනා ගනු ලබයි. නිශ්චිත කාල සීමාවක් තුළ අනියත වාර ගණනක් සේවාවන් සැපයූ විට සමාගම විසින් නිශ්චිත වූ කාල සීමාව තුළ ඍජු රේඛීය පදනමක් මත ආදායම හඳුනා ගනු ලබන අතර නිශ්චිත වූ කටයුත්තක් වෙනත් කටයුත්තකට වඩා වැදගත් වන විට වැදගත් කටයුත්ත සිදු කරන තුරු සමාගම විසින් ආදායම හඳුනා ගැනීම කල් දමනු ලැබේ.

#### 3.4.1.2 පොළී ආදායම

රැස් කර ගැනීම පිළිබඳ සැකයක් නොමැත්තේ නම් පොළී ආදායම ලද පොළිය (වත්කම්වලින් ලද ඵලදායී ආදායම සැලකිල්ලට ගෙන) ලෙස හඳුනා ගනු ලැබේ.

#### 3.4.1.3 වෙනත් ආදායම්

අනෙකුත් සියළු ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

### 3.4.2 වියදම් හඳුනා ගැනීම

#### 3.4.2.1 මෙහෙයුම් වියදම්

ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් කටයුතු සිදු කිරීමමේ දී හා දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදු වන වියදම් වසරට අදාළ ලාභය/ (පාඩුව) ගණනය කිරීමේ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට

ඇතුළත් කර ඇත. වෙළඳ ලැබීම් අඩුවීම, ප්‍රකාශිත බැරකම් හා දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම අඩුවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

### 3.4.2.2 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය රාජ්‍ය ණය හා බැංකු අයිරාවලට අදාළ පොළී වියදම්වලින් සමන්විත වේ. ලාභයට හා අලාභයට අදාළව සියළු ණය පිරිවැය සඵල පොළී ක්‍රමය භාවිතා කර හඳුනා ගැනේ.

### 3.4.2.2 බදු වියදම්

ආදායම් බදු වියදම් ජංගම හා විලම්භිත බදුවලින් සමන්විත වේ. සමකොටස්හි ඍජුව හඳුනාගෙන ඇති අයිතම හැර ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති අතර එවැනි අවස්ථාවල ඒවා සමකොටස් තුළ හඳුනා ගැනේ.

#### 3.4.2.3.1 ජංගම බදු

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා පසුව සම්මත කර ගන්නා ලද පනත් මගින් සංශෝධනය කරන ලද හෝ වාර්තා කරනු ලබන දිනය වන විට නිත්‍ය ලෙස පනවන ලද නීතිවලට අදාළ ප්‍රතිපාදන අනුව ඇගයීමට ලක් කරන ලද වසර සඳහා ගණනය කරන ලද බදු පැනවිය හැකි ආදායම මත දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවන ලද හෝ ගෙවීමට අපේක්ෂිත මුදල අනුව වර්තමාන හා සන්සන්දනාත්මක කාල සීමාවන් සඳහා ජංගම බදු වියදම ගණනය කරනු ලැබේ.

#### 3.4.2.3.2 විලම්භිත බදු පැනවීම

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සඳහා ඉදිරියට ගෙන යන වත්කම් හා බැරකම් ප්‍රමාණය සහ ඉදිරියේ දී ආපසු හැරවීමට අපේක්ෂිත පරිදි බදු පැනවීම සඳහා යොදා ගැනෙන ප්‍රමාණයන් අතර වන තාවකාලික වෙනස්කම්වලට අදාළව  ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කර විලම්භිත බදු පැනවීම හඳුනා ගැනේ.

වාර්තා කරනු ලබන දින වන විට පනවන ලද හෝ නිත්‍ය ලෙස පනවන ලද නීති මත පදනම්ව ආපසු හරින ලද තාවකාලික බදු වෙනසට අදාළ කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතයන් අනුව විලම්භිත බදු ගණනය කෙරේ.

ඉදිරියේ දී බදු පැනවිය හැකි ලාභයක් ඇති විය හැකි වන පරිදි දැනට ඉතිරි බදු අලාභ, බදු බැර හා අඩු කළ හැකි තාවකාලික බදු වෙනස සඳහා විලම්භිත බදු වත්කම හඳුනා ගැනේ.  විලම්භිත බදු සෑම වාර්තා කරනු ලබන දිනයක දී ම සමාලෝචනය කෙරෙන අතර තවදුරටත් අදාළ බදු ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වන ප්‍රමාණයට අඩු කෙරේ.

ජංගම බදු බැරකම්වලට එරෙහිව ජංගම බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව ක්‍රියාත්මක කළ හැකි හිමිකමක් ඇත්නම් සහ විලම්භිත බදු එකම බදු පැනවිය හැකි අස්තිත්වය හා එකම බදු පැනවීමේ අධිකාරයට සම්බන්ධ නම් විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු බැරකම් හිලව් කරනු ලැබේ.

### 3.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

"මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සකස් කරන ලද්දේ "වක්‍ර ක්‍රමය" භාවිතා කොටගෙනය. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා ගෙවන ලද පොළිය මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ ලෙස ද ලද පොළිය ආයෝජන මූල්‍ය ප්‍රවාහ ලෙස ද වර්ග කෙරේ.

### 3.6 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ගාස්තුවක් අය කරන්නේ ද නැතිද යන්න පිළිබඳ නොසලකා එක් පාර්ශවයකට අනෙක් පාර්ශවයේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ පාලනය කිරීම හෝ ඒවා කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කිරීමට හැකියාව ඇති ගණුදෙනු පිළිබඳ හෙළිදරව් කරන ලදී.

### 3.7 කොටසක ඉපැයීම්

සමාගම විසින් එහි සාමාන්‍ය කොටස් සඳහා කොටසක මූලික ඉපැයීම් (ඇපී) දත්ත ඉදිරිපත් කරනු ලැබේ. කොටසක මූලික ඉපැයීම් ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ ලාභය හෝ අලාභය අදාළ කාල සීමාව තුළ සාමාන්‍ය කොටස්හි බර තැබූ සාමාන්‍යයෙන් බෙදීම මගිනි.

### 3.8 වාර්තා කරනු ලබන කාල සීමාවෙන් පසුව සිදු වූ සිදුවීම්

වාර්තා කරන කරනු ලබන කාල සීමාව අවසානය හා නිකුත් කිරීම සඳහා අවසර ලද මූල්‍ය ප්‍රකාශනවල දිනය අතර කාලය තුළ සිදු වූ යහපත් හා අයහපත් සිදුවීම් වාර්තා කරනු ලබන කාල සීමවට පසුව සිදු වූ සිදුවීම් වේ. වාර්තා කරනු ලබන කාල සීමාවට පසුව සිදු වූ සිදුවීම්වල භෞතික ප්‍රතිඵල පිළිබඳ සැලකිල්ලට ගෙන අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශයන්ට යෝග්‍ය වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

**සටහන 04- ආදායම**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු: | රු: |
| පරිගණක පදනම් පුහුණු පහසුකම | **982,000** | 180,000 |
| මුහුණට මුහුණ පුහුණු පහසුකම | **1,709,300** | 441,000 |
| වීඩියෝ සංවාද පහසුකම | **6,000** | 6,000 |
| මුහුණට මුහුණ කුලී පහසුකම | **1,161,920** | - |
| පරිගණක පදනම් කුලී පහසුකම | **224,800** | 937,380 |
| ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ | **906,000** | - |
| මාර්ගගත විභාග | **12,888,570** | 9,232,671 |
| මාර්ගගත වැඩසටහන් | **6,189,300** | 7,689,500 |
| | **24,067,890** | 18,486,551 |

**සටහන 05 - විකුණුම් පිරිවැය**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| පරිගණක පදනම් පුහුණු පහසුකම | **580,473** | 119,465 |
| මුහුණට මුහුණ පුහුණු පහසුකම | **895,608** | 219,453 |
| වීඩියෝ සංවාද පහසුකම | **-** | - |
| මුහුණට මුහුණ කුලී පහසුකම | **589,023** | - |
| පරිගණක පදනම් කුලී පහසුකම | **127,991** | 502,702 |
| ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ | **422,070** | - |
| මාර්ගගත විභාග | **1,213,968** | 1,399,405 |
| මාර්ගගත වැඩසටහන් | **1,906,646** | 1,791,829 |
| | **5,735,779** | 4,032,854 |

**සටහන 06- වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| විවිධ ආදායම් | **1,896** | 18,843 |
| | **1,896** | 18,843 |

**සටහන 07- බෙදාහැරීමේ වියදම්**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| අලෙවි ප්‍රවර්ධන පිරිවැය | **79,670** | 69,019 |
| TBSI *- අලෙවි කළමනාකරු | **-** | - |
| TBSI -ප්‍රධාන විධායක නිලධාරි | **-** | - |
| ගමන් වියදම් - විභාග මධ්‍යස්ථාන වෙත සංචාර | **50,249** | 7,750 |
| අන්තර්ගත සංවර්ධන වියදම් | **-** | 80,000 |
| | **129,919** | 156,769 |

* TBSI = ඉලක්ක පදනම් විකුණුම් දිරි දීමනා

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

| සටහන 08- පරිපාලන වියදම් | 2022 | 2021 |
|---|---|---|
| | රු: | රු: |
| වැටුප් | **12,727,986** | 11,415,492 |
| සේඅඅ වියදම් | **1,534,566** | 1,409,459 |
| සේනිභාඅ වියදම් | **385,062** | 352,365 |
| අතිකාල වියදම් | **220,842** | 83,009 |
| පුහුණු සහ සංවර්ධන ගාස්තු | **31,000** | 15,000 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **623,375** | 526,700 |
| පරිපාලන සහකරුවන්ට නිල ඇඳුම් පිරිවැය | **22,000** | 16,185 |
| මණ්ඩලය රැස්වීම් සඳහා සහභාගි වීමේ ගාස්තු | **321,000** | - |
| විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගි වීමේ ගාස්තු | **159,000** | - |
| මණ්ඩල රැස්වීම් සහ විගණන රැස්වීම් සඳහා තේපැන් | **66,153** | - |
| සභාපති දීමනා | **412,500** | - |
| දුරකථන | **256,764** | 231,073 |
| විදුලි වියදම් | **2,734,953** | 2,167,188 |
| අන්තර්ජාල ගාස්තු | **153,695** | 197,484 |
| ඊමේල් සැකසීමේ ගාස්තුව | **185,424** | 133,152 |
| ප්‍රවාහන පිරිවැය | **89,141** | 16,790 |
| ඉන්ධන - සමාගමේ යතුරු පැදිය | **35,720** | 17,000 |
| ප්‍රධාන විධායක නිලධාරි සඳහා ඉන්ධන දීමනා | **556,950** | 306,000 |
| ප්‍රධාන විධායක නිලධාරි සඳහා වාහන දීමනා | **500,000** | 600,000 |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය පිරිවැය | **217,376** | 61,840 |
| පුවත්පත් සහ සඟරා වියදම් | **21,230** | 11,200 |
| උපකරණ නඩත්තුව (සටහන 8.1) | **1,221,322** | 1,011,653 |
| ගොඩනැගිලි නඩත්තුව (සටහන 8.2) | **356,905** | 24,515 |
| සෝපාන නඩත්තු කිරීමේ ගාස්තු | **414,752** | 395,000 |
| යතුරු පැදිය නඩත්තුව | **83,827** | 54,840 |
| සෞඛ්‍ය රක්ෂණය | **475,080** | 387,205 |
| යතුරු පැදි රක්ෂණය | **17,143** | 11,265 |
| ගිනි රක්ෂණය | **72,243** | 62,621 |
| ක්ෂය වීම් | **3,188,666** | 1,438,769 |
| බදු කුලී ක්‍රමක්ෂය | **1,655,059** | 1,655,059 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | **897,944** | 794,360 |
| විගණන ගාස්තු | **649,065** | 221,950 |
| බදු පිරිවැටුම් ගොනුගත කිරීමේ ගාස්තු | **76,590** | 55,000 |
| ලේකම් ගාස්තු | **277,570** | 60,403 |
| බැංකු ගාස්තු | **11,480** | 8,840 |
| කාර්ය මණ්ඩලය සඳහා තේ වියදම් | **240,061** | 74,865 |
| වාර්ෂික වාර්තාව පරිවර්තනය, සැකසීම සහ මුද්‍රණ ගාස්තු | **277,550** | 53,970 |
| ඡායා පිටපත් යන්ත්‍ර කුලිය | **78,450** | 43,921 |

| | | |
|---|---|---|
| පරිවර්තන ගාස්තු | **91,728** | 27,500 |
| වතුර බෝතල් | **45,912** | 16,200 |
| සුළු අලුත්වැඩියා | **1,995** | 39,850 |
| සෞඛ්‍ය සහ සුරක්ෂිතතා නඩත්තු පිරිවැය | **4,365** | 64,830 |
| කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල දීමනා | **32,000** | 8,000 |
| රැස්වීම් සඳහා ආහාරපාන | **32,685** | 6,800 |
| කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ වියදම | **25,000** | - |
| විදුලි ජනක යන්ත්‍ර සඳහා ඩීසල් (සටහන 8.1.1) | **438,600** | - |
| ප්‍රසම්පාදන කමිටු රැස්වීම | **4,000** | - |
| | **31,924,728** | 24,077,354 |

| **සටහන 8.1** | **2022** | 2021 |
|---|---|---|
| ජල පිරිසිදුකරණය සඳහා කුලිය | **43,258** | 39,000 |
| UPS සඳහා කුලිය | **418,504** | 456,011 |
| සිසිලන කුළුණ සඳහා රසායනික පිරිවැය | **58,096** | 41,258 |
| විදුලි ජනක යන්ත්‍ර සඳහා ඩීසල් (සටහන 8.1.1) | **-** | 127,000 |
| වායු සමීකරණ නඩත්තු පිරිවැය | **122,023** | 185,870 |
| පරිගණක, ලැප්ටොප් සහ මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා ගාස්තු | **94,730** | 89,000 |
| ඇඟිලි සලකුණු යන්ත්‍රය වාර්ෂික ගිවිසුම් ගාස්තු | **28,000** | 17,500 |
| වෙනත් නඩත්තු කටයුතු පිරිවැය | **27,270** | 56,015 |
| විදුලි ජනක යන්ත්‍ර නඩත්තු ගිවිසුම | **168,890** | - |
| පරණ බැටරි | **110,450** | - |
| SSD කාඩ්පත් සහ් දෘඩාංග | **150,100** | - |
| | **1,221,322** | 1,011,653 |

| **සටහන 8.2** | |
|---|---|
| DLC නඩත්තු කටයුතු | **356,905** |
| | **356,905** |

සටහන 8.1.1 - විදුලි ජනක යන්ත්‍රය සඳහා ඩීසල් පිරිවැය 2022 පරිපාලන වියදම් යටතේ වෙන වෙනම පෙන්වයි.

**සටහන 09 - ශුද්ධ මූල්‍ය ආදායම**

| | රු: | රු: |
|---|---|---|
| **මූල්‍ය ආදායම** | | |
| ස්ථාවර තැන්පතු පොළී ආදායම | **10,769,556** | 5,670,290 |
| අරමුදල් කළමනාකරණ ගිණුම මත පොළිය | **782,876** | 249,998 |
| | **11,552,432** | 5,920,289 |
| **අඩු කළා : මූල්‍ය පිරිවැය** | | |
| විනිමය අනුපාත වෙනස | **29,075** | 22,240 |
| රාජ්‍ය ණය පොළී | **-** | - |
| | **29,075** | 22,240 |
| | **11,523,357** | 5,898,049 |

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

**සටහන 10- ආදායම් බදු වියදම්**

**10.1- ජංගම බදු**

පසුකාලීන සංශෝධන පනත් මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව සමාගම පළමු කාල සීමාව සඳහා 24% සහ 2 වන කාල සීමාව සඳහා 30% ක අනුපාතයකින් වගකීම දරයි.

| | **2022** | 2021 |
|---|---|---|
| | **රු:** | රු: |
| වත්මන් වසරේ ලාභයේ බදුකරණය (සටහන 10.2) | | 1,420,869 |
| බදු සඳහා අධි/ඌණ ප්‍රතිපාදන | | |
| වසර තුළ ප්‍රත්‍යාවර්තනය කළ/ (හඳුනාගත්) විලම්භිත බදු වත්කම් | **(2,053,051)** | 2,821,392 |
| | **(2,053,051)** | 4,242,261 |

**10.2 ගිණුම්කරණ ලාභය සහ බදු අය කළ හැකි ලාභය අතර සැසැඳීම**

| | | |
|---|---|---|
| ආදායම් බදු වියදම්වලට පෙර ගිණුම ලාභය | **(2,197,283)** | (3,848,049) |
| ඉඩ නොදුන් අයිතම සාමාන්‍යය | **5,467,100** | 3,620,528 |
| ඉඩ දුන් අයිතම සාමාන්‍යය | **(2,825,893)** | (2,819,627) |
| පොලී ආදායම | **(11,552,432)** | (5,920,288) |
| ව්‍යාපාරයෙන් බදු අය කළ හැකි ලාභය/(අලාභය) | **(11,108,508)** | (8,967,436) |
| | | |
| වසර තුළ උපයෝජිත බදු පාඩුව | | - |
| බදු අය කළ හැකි ආදායම | **11,552,432** | 5,920,288 |
| | | |
| ව්‍යාපාර ආදායම මත 24% ආදායම් බද්ද | | - |
| ආයෝජන ආදායම මත 30% ආදායම් බද්ද | **-** | 1,420,869 |
| වත්මන් වසරේ ලාභය මත බදුකරණය | **-** | 1,420,869 |

**10.3 බදු පාඩුව සැසැඳීම**

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ බදු පාඩුව | **76,237,224** | 89,682,448 |
| **වසර තුළ උපයෝජිත බදු පාඩුව** | | |
| ව්‍යාපාර ආදායමට අනුව අඩු කළ | | - |
| ආයෝජන ආදායමට අනුව අඩු කළ | | - |
| ඉදිරියට ගෙන ආ බදු පාඩුව | **76,237,224** | 89,682,448 |

## 11. සාමාන්‍ය කොටසකට ඉපයුම්/(පාඩුව)

කොටසකට ඉපැයීම් / (අලාභය) ගණනය කිරීම සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය / (අලාභය) මත පදනම්ව වසර අවසානයේ දී ඉතිරිව ඇති සාමාන්‍ය කොටස්වල බර කළ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම පහත පරිදි ගණනය කෙරේ.

| | 2022 | 2021 |
|---|---|---|
| **සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය / (පාඩුව)** | රු: | රු: |
| බදු ගෙවීමෙන් පසු සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය | **(4,250,333)** | (8,105,796) |
| **සාමාන්‍ය කොටස් ගණන** | | |
| වසර තුළ හිඟ සාමාන්‍ය කොටස් ගණනේ බරතැබූ සාමාන්‍යය | **14,206,509** | 14,206,509 |
| **කොටසකට ඉපයීම්/ (අලාභය) (රු)** | **(0.30)** | (0.57) |

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

සටහන **12-** දේපළ, පිරියත සහ උපකරණ

| | සින්නක්කර | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගෘහ භාණ්ඩ සහ කාර්යාල පරිගණක සවි කිරීම් | උපකරණ | උපකරණ | මෝටර් වාහන | පරතරය අඩු කිරීම සහ ඉගැන්වීම් උපකරණ | එකතුව |
| 12.1 **පිරිවැය** | රු: | රු: | රු: | රු: | රු: | රු: |
| 2022 ජනවාරි 1 වන දිනට ශේෂය | 2,569,910 | 382,902 | 10,147,044 | 300,001 | 1 | 13,399,857 |
| වසර තුළ එකතු කිරීම් | - | 31,331 | - | - | - | 31,331 |
| වසර තුළ බැහැර කිරීම් / (මාරු කිරීම) | - | - | - | - | - | - |
| **2022** දෙසැම්බර් **31** වන දිනට ශේෂය | **2,569,910** | **414,233** | **10,147,044** | **300,001** | **1** | **13,431,188** |
| 12.2 **සමුච්චිත ක්ෂය වීම සහ ක්‍රමක්ෂය** | | | | | | |
| 2022 ජනවාරි 1 වන දිනට ශේෂය | - | - | - | - | - | - |
| වසර සඳහා ගාස්තුව | 672,050 | 197,616 | 2,207,000 | 60,000 | 52,000 | 3,188,666 |
| වසර තුළ බැහැර කිරීම් / (මාරු කිරීම) | - | - | - | - | - | - |
| **2022** දෙසැම්බර් **31** වන දිනට ශේෂය | **672,050** | **197,616** | **2,207,000** | **60,000** | **52,000** | **3,188,666** |
| 2021 දෙසැම්බර් 31 දිනට | 14,910 | 270,891 | 1,360,044 | 1 | 1 | 1,645,846 |
| **2022** දෙසැම්බර් **31** දිනට | **1,897,860** | **216,617** | **7,940,044** | **240,001** | **(51,999)** | **10,242,523** |

**12.3** දේපළ, පිරියත සහ උපකරණ නැවත ඇගයීම පිළිබඳ සටහන්

2022.01.01 දිනට ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් හි මුළු වත්කම් පිරිවැය ර්. 59,741,042 ක් විය. වත්කම් නැවත තක්සේරු කිරීමේ කමිටුව හරහා රුපියල් 42,961.00 ක පොත් වටිනාකමක් ඇති, බැහැර කිරීමට රු.28,586,090 ක පිරිවැයක් හඳුනාගෙන ඇත.

2022.01.01 දිනට රුපියල් 1,645,847 ක පොත් වටිනාකමක් ඇති රුපියල් 31,154,952 වත්කම්වල පිරිවැය රුපියල් 13,871,751 දක්වා නැවත තක්සේරු කරන ලදී. නැවත තක්සේරු කිරීමේ සංචිතය රුපියල් 12,225,904 කි. නැවත ඇගයීමේ ක්‍රියාත්මක දිනය 2022.01.01 වේ.

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

**සටහන 13- වෙනත් ජංගම වත්කම්**

| **සටහන 13.1 - දීර්ඝ කාලීන ආයෝජන** | **රු:** | රු: |
|---|---|---|
| ස්ථාවර තැන්පතු (සටහන අංක 13.2.1) | **-** | 28,936,610 |
| | **-** | 28,936,610 |

| **සටහන 13.2 - කෙටි කාලීන ආයෝජන** | | |
|---|---|---|
| කෙටි කාලීන ආයෝජන (සටහන අංක 13.2.1) | **89,256,969** | 55,377,594 |
| | **89,256,969** | 55,377,594 |

**සටහන 13.2.1** - දිගුකාලීන ආයෝජන 2022 දී කෙටි කාලීන ආයෝජන ලෙස නැවත සැලසුම් කරන ලදී.

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

**සටහන 14- බදු කුලී**

සමාගම විසින් ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය (SLIDA) සමඟ බදු ගිවිසුමක් අත්සන් කර ඇති අතර එහිදී සමාගම විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල බදු දීමට බදු දෙන්නා එකඟ වී ඇත. මෙම පිරිවැය 2003 ජනවාරි 1 සිට 2032 දෙසැම්බර් 31 දක්වා වසර 30 ක කාලයක් සඳහා කුලී අත්තිකාරමක් ලෙස සලකනු ලබන අතර වසර 30 කට වැඩි විස්තීරණ ආදායම් ප්‍රකාශය සඳහා කල්බදු අත්තිකාරම් ගෙවීම අය කෙරේ. කෙසේ වුවත් බදු ගිවිසුම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නැත.

| | 2022 | 2021 |
|---|---|---|
| | රු: | රු: |
| ගෙවූ කුලී අත්තිකාරම | **49,651,765** | 49,651,765 |
| එක් කළා - බදු වත්කම් පිරිවැය සඳහා ගැලපුම | - | - |
| | **49,651,765** | 49,651,765 |
| අඩු කළා: බදු කුලිය ලෙස ලියා හරින ලද මුළු මුදල | **(31,446,121)** | (29,791,062) |
| වත්මන් වසරේ බදු ක්‍රමක්ෂය | **(1,655,059)** | (1,655,059) |
| කල්බදු වත්කම් සමුච්චිත ක්ෂය කිරීම සඳහා ගැලපීම | | |
| | **16,550,585** | 18,205,644 |

**සටහන 15 - විලම්භිත බදුකරණය**

| | රු: | රු: |
|---|---|---|
| වසර ආරම්භයේදී | **3,693,160** | 6,514,552 |
| වසර සඳහා ප්‍රත්‍යාවර්තනය / (ගාස්තුව) | (2,053,051) | (2,821,392) |
| වසර අවසානයේදී | **1,640,109** | 3,693,160 |

මූල්‍ය වාර්තා කිරීමේ අරමුණ සඳහා සමාගමේ වත්කම් සහ වගකීම්වල වටිනාකම සහ 14% ට අධ්‍යාපනික සේවාව සහ 24% පොළී ආදායම මත පදනම් වූ බර කළ සාමාන්‍ය අනුපාතයට බදුකරණය සඳහා භාවිතා කරන මුදල සහ පොලී ආදායම අතර තාවකාලික වෙනස්කම් සඳහා ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බද්ද සපයනු ලැබේ.

වසර අවසානයේ විලම්භිත බදු වත්කම් පහත පරිදි වේ,

| | **2022** | | 2021 | |
|---|---|---|---|---|
| | **තාවකාලික වෙනස** | **බදු බලපෑම්** | තාවකාලික වෙනස | බදු බලපෑම් |
| | රු: | රු: | රු: | රු: |
| ඉදිරියට ගෙන ආ බදු පාඩුව | **11,435,584** | **2,916,073.81** | 17,933,392 | 2,944,524 |
| දේපළ, පිරියත සහ උපකරණ | **(9,591,502)** | **(2,445,833)** | 595,162 | 97,720.94 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | **4,587,720** | **1,169,868.60** | 3,964,345 | 650,914.78 |
| | **6,431,802** | **1,640,109.43** | 22,492,899 | 3,693,160 |

වත්මන් මූල්‍ය වර්ෂය වෙත ගෙන එන ලද බදු අලාභය සම්බන්ධයෙන් කල් ඇමූ බදු වත්කම් හඳුනාගෙන ඇත.

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

**සටහන 16- වෙළෙඳ සහ වෙනත් ලැබීම්**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු: | රු: |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | **868,820** | 5,474,867 |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් (සටහන 16.1) | **676,000** | 423,000 |
| ලැබිය යුතු පොළී | **8,015,226** | 2,755,650 |
| | **9,560,046** | 8,653,517 |

**16.1 - අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්**

| | | |
|---|---|---|
| සේවකයන්ට ලබාදුන් වැටුප් අත්තිකාරම් | **560,000** | 324,000 |
| උත්සව අත්තිකාරම් ගිණුම | **81,000** | 99,000 |
| වෙනත් අත්තිකාරම් | **35,000** | - |
| | **676,000** | 423,000 |

**සටහන 17- අයකරගත යුතු ජංගම බදු**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බද්ද මත පොළී ආදායම | **759,039** | 759,039 |
| ආදායම් බද්ද - ස්වයං තක්සේරු ගෙවීම | **484,223** | 484,223 |
| ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු | **512,981** | 512,980 |
| ලැබිය යුතු බදු ශේෂය (සටහන 17.1) | **2,864,509** | 2,864,509 |
| | **4,620,752** | 4,620,751 |

සටහන 17.1 - DLC වෙත රු.2,864,509/-ක ආපසු ගෙවීමේ දැන්වීමක් ලැබී ඇත.

**සටහන 18- මුදල් හා මුදල් සමාන දෑ**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| **හිතකර ශේෂයන්** | | |
| අතැති මුදල් | **25,000** | 25,000 |
| බැංකුවල මුදල් - ලංකා බැංකුව: ගිණුම් අංක. 0002323189 | **349,770** | 225,315 |
| අරමුදල් කළමනාකරණ ගිණුම | **3,706,808** | 7,594,213 |
| ඇමතුම් තැන්පතු - ලංකා බැංකුව | **8,000,000** | - |
| | **12,081,578** | 7,844,528 |

**සටහන 19 - ප්‍රකාශිත ප්‍රාග්ධනය**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ (සාමාන්‍ය කොටස් 14,206,509) | **142,065,090** | 142,065,090 |
| | **142,065,090** | 142,065,090 |

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

**සටහන 20 - සේවක ප්‍රතිලාභ**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු: | රු: |
| වසර ආරම්භයේදී ශේෂය | **3,964,345** | 3,437,645 |
| වසර තුළ සැපයූ ප්‍රතිපාදන / (ප්‍රත්‍යාවර්තන) | **623,375** | 526,700 |
| වසර අවසානය ශේෂය | **4,587,720** | 3,964,345 |

**සටහන 21- වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු**

| | | |
|---|---|---|
| | රු: | රු: |
| වෙළෙඳ ගෙවීම් | **-** | 6,000 |
| උපචිත වියදම් (සටහන 21.1) | **3,619,861** | 3,342,003 |
| | **3,619,861** | 3,348,003 |

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**
**28/10, මලලසේකර මාවත, කොළඹ 07**

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2022

| සටහන - දෙසැම්බර් 31 වන දිනට උපචිත වියදම් | 2022 | 2021 |
|---|---|---|
| | රු: | රු: |
| ACCA පිරිවැය | - | 16,612 |
| අතිකාල | **20,840** | 10,956 |
| පුවත්පත් | **3,710** | 1,060 |
| විදුලි වියදම් | **268,492** | 217,674 |
| ජලය | **4,935** | 9,000 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | **77,850** | 67,950 |
| දුරකථන | **23,641** | 18,946 |
| අන්තර්ජාල ගාස්තු | **67,398** | 61,714 |
| මුද්‍රණ සහ ලිපි ලේඛන | **210** | 1,640 |
| EPF | **201,892** | 303,408 |
| ETF | **30,284** | 45,511 |
| PAYE (සටහන 21.1.1) | **5,016** | 2,148 |
| මුද්දර ගාස්තු | **825** | 825 |
| මණ්ඩලය විසින් අනුමත කළ සූත්‍රයට අනුව විශේෂ ගෙවීම / ප්‍රසාද දීමනා (සටහන 21.1.2) | **1,175,000** | 1,175,000 |
| විගණන ගාස්තු (සටහන 21.1.3) | **965,359** | 571,950 |
| වැටුප් | - | 250,000 |
| ඡායා පිටපත් යන්ත්‍ර කුලිය | **6,016** | 15,115 |
| උපකරණ නඩත්තුව | **159,385** | 76,002 |
| ගොඩනැගිලි නඩත්තු කටයුතු | **28,000** | - |
| පරිවර්තන ගාස්තු | **21,281** | - |
| සභාපති වෙත දීමනා | **37,500** | - |
| ආදායම් බදු සහ පිරිවැටුම් ගොනුගත කිරීමේ ගාස්තු | **175,000** | 105,000 |
| මෝටර් වාහන නඩත්තුව | - | 150 |
| තේ වියදම් | **11,892** | 6,468 |
| ආහාර - නිල | **560** | |
| ලේකම් ගාස්තු | **116,586** | - |
| පරිගණක පදනම් පුහුණුව -DLC පිරිවැය | **130,300** | - |
| මාර්ගගත වැඩසටහන් පිරිවැය | **16,240** | 380,645 |
| අලෙවි ප්‍රවර්ධන පිරිවැය | - | 2,500 |
| ගමන් වියදම් | **3,600** | 1,730 |
| මුහුණට මුහුණ කෙරෙන වැඩසටහන් පිරිවැය | **64,800** | - |
| මුහුණට මුහුණ කුලී පිරිවැය | **3,250** | - |
| | **3,619,861** | 3,342,003 |

**සටහන 21.1. 1 උපයන විට ගෙවීමේ බද්ද PAYEE**

PAYEE සේවකයන්ගේ වැටුපෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු ලැබේ.

**සටහන 21.1. 2 ප්‍රසාද දීමනා**

ප්‍රසාද දීමනා / විශේෂ ගෙවීම් සඳහා ප්‍රතිපාදන, 2017 සිට 2019 දක්වා මණ්ඩලය විසින් අනුමත සූත්‍රයට අනුව සිදු කෙරිණි.

**සටහන 21.1. 3 විගණන ගාස්තු**

විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන පහත පරිදි වේ,

| | |
|---|---|
| මුල්‍ය වර්ෂය 2020 | **231,600** |
| මුල්‍ය වර්ෂය 2021 | **266,340** |
| මූල්‍ය වර්ෂය 2022 සඳහා ප්‍රතිපාදන | **300,000** |
| අභ්‍යන්තර විගණන ගෙවීම 2022 දෙසැම්බර් | **17,419** |
| අභ්‍යන්තර විගණකසඳහා ප්‍රතිපාදන 2019 | **150,000** |
| | **965,359** |

**සටහන 22- අත්තිකාරම් ලැබීම්**

| | **2022** | **2021** |
|---|---|---|
| | රු: | රු: |
| ප්‍රසිද්ධ සම්මන්ත්‍රණය සඳහා ලැබුණු අත්තිකාරම | **28,000** | **12,000** |
| බස්නාහිර පලාත් වැඩසටහන සඳහා ලැබුණු අත්තිකාරම | **6,860,000** | **-** |
| ඌව පළාත් වැඩසටහන සඳහා ලැබුණු අත්තිකාරම | **-** | **300,000** |
| | **6,888,000** | **312,000** |

**සටහන 23- ආශ්‍රිත පාර්ශව ගනුදෙනු**

වර්ෂය තුළ අදාළ පාර්ශ්ව ගනුදෙනු කිසිවක් නොතිබුණි.

**සටහන 23.1- ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS.24 අනුව "ආශ්‍රිත පාර්ශ්ව අනාවරණ ලබන ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු අස්ථිත්වයේ කටයුතු සැලසුම්කරණය, යොමු කිරීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය සහ වගකීම ඇති පුද්ගලයන් ය. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස ලෙස හඳුනාගෙන ඇත.

*කෙටුම්පත* *පිටුව 5 න් 1*

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**

**TIN : 134008989 0000**

**ඇගයීම් වසර 2022- 23**

**ගෙවිය යුතු ආදායම් බදු ගණනය කිරීම**

*(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)*

| | | | | |
|---|---|---|---|---|
| **බදු අය කළ හැකි ආදායම ගණනය කිරීම** | | සටහන් | | |
| | | *උපලේඛනය* | | |
| ව්‍යාපාරයෙන් තක්සේරු කළ හැකි ආදායම | | ***A*** | | - |
| ආයෝජනවලින් තක්සේරු කළ හැකි ආදායම | | | | |
| | ස්ථාවර තැන්පතු පොළී ආදායම | | 10,769,556 | |
| | අරමුදල් කළමනාකරණ ගිණුම මත පොළිය | | 782,876 | |
| **අඩු කළා** | හිමිකම් කියූ පාඩු | | (11,552,432) | - |
| **බදු අය කළ හැකි ආදායම** | | | | - |
| **ගෙවිය යුතු ආදායම් බදු** | | | | |
| **අ. බදු අය කළ හැකි ආදායම මත බදු** | | | | |
| බදු අය කළ හැකි ආදායම මත බද්ද 1 වන කාල සීමාව | | @ 24% | | |
| බදු අය කළ හැකි ආදායම මත බදු ශේෂය | | | | |
| | 2 වන කාල සීමාව | @ 30% | - | - |
| | | | - | - |
| **අඩු කළා : බදු බැර** | | | | |
| **ගෙවිය යුතු ශේෂ ආදායම් බදු / හෝ (ආදායම් බදු ආපසු ගෙවිය යුතු)** | | | | - |
| 2018/19 ඇගයීම් වසරවල සිට ඉදිරියට ගෙන ආ ආදායම් බදු ගෙවීම් | | | | 955,207 |
| 2019/20 ඇගයීම් වසරවල සිට ඉදිරියට ගෙන ආ ආදායම් බදු ගෙවීම් | | | | 292,899 |
| | | | | **1,248,106** |

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**

**TIN : 134008989 0000**

**ඇගයීම් වසර 2022- 23**

**ව්‍යාපාරයෙන් තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම**

*(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)*

| | | සටහන් | | |
|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව බදු වලට පෙර ලාභය/(අලාභය). | | | | (2,197,283) |
| **අඩු කළා :** | **නිදහස් මුදල්, අවසාන රඳවා ගැනීමේ ගෙවීම් සහ වෙනත් මූලාශ්‍ර** | | | |
| | ස්ථාවර තැන්පතු පොළී ආදායම | | 10,769,556 | |
| | අරමුදල් කළමනාකරණ ගිණුම මත පොළිය | | 782,876 | (11,552,432) |
| | | | | (13,749,715) |
| **එකතු කළා :** | **ඉඩ නොදෙන අඩු කිරීම්** | | | |
| | පාරිතෝෂික ප්‍රතිපාදන | *1* | 623,375 | |
| | PPE මත ගිණුම්කරණ ක්ෂය කිරීම | | 3,188,666 | |
| | ක්‍රමක්ෂය | | 1,655,059 | 5,467,100 |
| | | | | (8,282,615) |
| **අඩු කළා :** | **ඉඩ දෙන අඩු කිරීම්** | | | |
| | ගෙවන ලද පාරිතෝෂික | | - | |
| | ගෙවූ බදු වාරික | | 1,655,059 | |
| | ක්ෂය කළ හැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා | *2* | 1,170,834 | (2,825,893) |
| | | | | (11,108,508) |

| | | |
|---|---|---|
| අඩු කළා : | හිමිකම් කියූ පාඩු | - |
| **ව්‍යාපාරයෙන් තක්සේරු කළ හැකි ආදායම / (ව්‍යාපාරික පාඩුව)** | | **(11,108,508)** |

# ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර්

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් හි කොටස් හිමියන්ගේ වාර්ෂික මහ සභා රැස්වීම 2023 මැයි 29 වන අඟහරුවාදා දින 4 වන මහල, අංක 28/10 මළලසේකර මාවත කොළඹ 07 පිහිටි ලියාපදිංචි කාර්යාලයේදී ප.ව.2.00 ට පැවැත්වෙන බවට මෙයින් දැනුම්දෙනු ලැබේ.

න්‍යාය පත්‍රය

1. රැස්වීම කැඳවීමේ දැන්වීම කියවීම.
2. සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ගිණුම් ප්‍රකාශය එහි විගණකවරුන්ගේ වාර්තාව සමග ලබා ගැනීම සහ සලකා බැලීම.
3. සමාගම් ව්‍යවස්ථාවේ 95 වන වගන්තිය අනුව කස්තුරි නානායක්කාරගේ නාලනී මල්කාන්ති බණ්ඩාර මෙය නැවත පත් කිරීම.
4. සමාගම් ව්‍යවස්ථාවේ 95 වන වගන්තිය අනුව කරුණානායක තනන්නැහැලාගේ ඉන්දික ප්‍රේමරත්න මයා නැවත පත් කිරීම.
5. සමාගම් ව්‍යවස්ථාවේ 95 වන වගන්තිය අනුව සෙල්වනාදන් අනෝජන් මයා නැවත පත් කිරීම.

**මණ්ඩලයේ නියෝගය අනුව**

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්**

**සමාගම් ලේකම්වරු**

**දිනය** - 2023 මැයි 23

**ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර්**

පෙරකලාසි ආකෘතිය

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කොටස්කරුවකු/ කොටස්කරුවන් වන ..........................................හි ..........................................................................................................................................වන මම/ අපි* ...............................................................................හි ............................................................................. හෝ ඔහුට/ ඇයට* නොහැකි අවස්ථාවක දී

කොළඹ කලාටුවගේ දොන් නීල් රංජිත් අශෝක මහතා හෝ ඔහුට නොහැකි අවස්ථාවක

කොළඹ කරුණානායක තනන්නැහැලාගේ ඉන්දික ප්‍රේමරත්න මහතා හෝ ඔහුට නොහැකි අවස්ථාවක

කොළඹ කස්තුරි නානායක්කාරගේ නාලනී මල්කාන්ති බණ්ඩාර මෙය හෝ ඇයට නොහැකි අවස්ථාවක

කොළඹ මිෂෙල් අලීකී ටානියා පෙරේරා මෙය හෝ ඔහුට නොහැකි අවස්ථාවක

කොළඹ සෙල්වනාදන් අනෝජන් මයා (මිෂෙල් අලීකී ටානියා පෙරේරා මෙයගේ විකල්ප අධ්‍යක්ෂ)

2022 මැයි 29 වන දින ප ව 2.00 පැවැත්මාවීමට නියමිත සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමෙහි දී සහ එහි කල්තැබුණු රැස්වීමක දී සහ එයින්මා මතු පවත්වන ඡන්දයක දී මා/ අපඟ වෙනුවෙන් මා/අප සඳහා* මාගේ/අපගේ* නියෝජිතයා ලෙස මෙයින් පත් කරමි/ කරමු.

..........................................

කොටස්කරුවාගේ අත්සන

2023 .............දින අත්සන් තබන ලදී.

පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.

1. තමන් වෙනුවෙන් සහභාගි වීම හා ඡන්දය පාවිච්චි කිරීම සඳහා පෙරකලාසිකරුවකු පත් කිරීමට සාමාජිකයකුහට හිමිකම ඇත.
2. පෙරකලාසිකරුවකු සමාගමේ සාමාජිකයකු වීම අවශ්‍ය නොවේ.
3. රැස්වීමෙහි දී පෙරකලාසිකරුවකු මගින් ඡන්දය භාවිතා කිරීමට අවශ්‍ය සාමාජිකයකුට මෙහි දැක්වෙන ආකෘති පත්‍රය භාවිතා කළ හැකි අතර එයට "කථා කිරීමේ අයිතිය" ඇතුළත් කළ හැකිය.
4. වලංගුභාවය සඳහා සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය රැස්වීමට පැය 48කට නොඅඩු කාලයකට පෙර සමාගමේ ලියාපදිංචි කරන ලද කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.
5. සමාගමක/ සංස්ථාවක පෙරකලාසිය එහි පොදු මුද්‍රාව යටතේ විය යුතු අතර එය මේ සමග යා කර එහි ව්‍යවස්ථා මගින් දක්වා ඇති ආකාරයට සහතික කර තිබිය යුතුය.